වාර්ෂික වාර්තාව
2019

ජල සම්පත් මණ්ඩලය

මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය

පටුන
පිටු අංකය

හැඳින්වීම 04

දැක්ම 05

මෙහෙවර 05

අරමුණු 06

කාර්යයන් 06

ආයතනික තොරතුරු 07

ආයතනික පාලන ව්‍යුහය 08

පෙර ගමන්කරුවන්

විගණන හා කළමනාකරණ කමිටුව

ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන්

භෞතික හා මූල්‍ය ප්‍රගතිය 09

කාර්යය මණ්ඩල තොරතුරු 11

වටිනාකමින් වැඩි වත්කම් 13

ප්‍රධාන ක්‍රියාකාරකම් 14

2019 වර්ෂය තුල ක්‍රියාත්මක කරනු ලැබූ මෙහෙයුම් කාර්යයන් 15

මූල්‍ය ප්‍රකාශන 30

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

මූල්‍ය තත්ත්වය ප්‍රකාශය

ශුද්ධ වත්කම් / හිමිකම් වෙනස්වීම් ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

භාණ්ඩාගාර ප්‍රදාන අනාවරණය කිරීම

ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශයට සටහන්

විගණකාධිපති වාර්තාව 49

විගණකාධිපති වාර්තාව පිළිබඳ අදහස් දැක්වීම 59

2019 ව්‍යාපෘතීන්හි භෞතික ප්‍රගතියේ සාරාංශය 64

හැඳින්වීම

1964 අංක 29 දරණ ජල සම්පත් පනත යටතේ 1966 දී ස්ථාපිත කරන ලද ජල සම්පත් මණ්ඩලය ශ්‍රී ලංකාවේ ජල සම්පත් පාලනය හා ඵලදායී අයුරින් උපයෝගී කරගැනීම ආදී සියළු කරුණු පිළිබඳව විෂයභාර අමාත්‍යවරයාට උපදෙස් දෙන ආයතනයක් වශයෙන් පැවතිණි.

1978 දී වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ භූජල අංශය ජල සම්පත් මණ්ඩලයට අනුයුක්ත කරන ලද බැවින් මණ්ඩලයේ කාර්යයන් පුළුල්ව ක්‍රියාත්මක විය. උපදේශක සේවාවක්ව පැවති ජල සම්පත් මණ්ඩලය වාණිජමය කාර්යයන් හි නියැලීමට හැකිවන පරිදි හා ශ්‍රී ලංකාවේ භූගත ජල සම්පතට අදාළ කරුණු සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කිරීමට ජල සම්පත් මණ්ඩලයට බලය පවරාදීම සඳහා ජලසම්පත් මණ්ඩල පනත 1999 දී පාර්ලිමේන්තුවට ඉදිරිපත්කර සංශෝධනය කරන ලදී.

2017 මාර්තු 16 වන දින නිකුත් කරන ලද අති විශේෂ ගැසට් පත්‍ර අංක 2010/23 අනුව දක්වන ලද කටයුතු සඳහා ස්වභාවික ජල උල්පත් හා භූගත ජලය භාවිතා කිරීමට ජල සම්පත් මණ්ඩලයේ අධීක්ෂණය හා මඟ පෙන්වීම ලබා ගත යුතු බව නියම කරන ලදී.

දැක්ම

පිරිසිදු හා ආරක්ෂිත ජලය සැමට ප්‍රමාණවත් පරිදි ලබාදීම.

මෙහෙවර

පොදු මහජනතාව, අදාල රාජ්‍ය දෙපාර්තමේන්තු/ අධිකාරී/ ආයතන/ ජාතික හා ජාත්‍යන්තර සංවිධාන හා දේශීය මෙන්ම විදේශීය විශේෂඥ සහ වෘතීයවේදී කණ්ඩායම් සමඟ සමීප සම්බන්ධතාවයක් ඇතිකර ගනිමින් ශ්‍රී ලංකාවේ භූ ගත ජල සම්පත තක්සේරු කිරීම, ආරක්ෂා කිරීම, සංවර්ධනය කිරීම සහ භාවිතා කිරීම සම්බන්ධයෙන් රජයට හා ජනතාවට උපදෙස් ලබාදීම.

අරමුණු

- දිවයිනෙහි භූගත ජල සම්පත් පිළිබඳව පර්යේෂණ සිදු කිරීම.
- භූගත ජල සම්පත් පිළිබඳ වූ විද්‍යාත්මක දත්තයන් එක්රැස් කිරීම.
- භූගත ජල විද්‍යාත්මක සමීක්ෂණ සිදු කිරීම.
- භූගත ජල සම්පත් පරිහරණය පිළිබඳ වූ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- භූගත ජල සම්පත් තක්සේරු කිරීම.
- වෙනත් ආයතන හා සම්බන්ධ වී මණ්ඩලයේ කාර්යයන් ක්‍රියාත්මක කිරීම.
- භූගත ජල සම්පත් සංවර්ධනය හා කළමනාකරණය කිරීම.

කාර්යයන්

- භූගත ජල සම්පත් සංවර්ධනය සඳහා පවතින දත්තයන්හි භූ විද්‍යාත්මක අදහස් දැක්වීම.
- භූගත ජල සම්පත් ගවේශණය පිණිස භූජල විද්‍යාත්මක සමීක්ෂණ සිදු කිරීම.
- භූගත ජල විභවයන් පවතින ස්ථාන හඳුනා ගැනීම.
- භූගත ජල මූලාශ්‍ර පවතින ස්ථාන ඒවායේ විභවයන් හා ගුණාත්මක බව විද්‍යාත්මක ලෙස නීර්ණය කිරීම
- භූගත ජල සම්පත් සංවර්ධනය කිරීම සඳහා ශක්‍යතා අධ්‍යනයන් සිදු කිරීම.
- රසායනික හා භෞතික ලක්ෂණ හඳුනාගැනීම සඳහා මෙන්ම ක්ෂුද්‍ර ජීවී සහ බැර ලෝහ සඳහා ද ජල නියැදියන් විශ්ලේෂණය කිරීම
- භූ ජල දත්ත එක්රැස් කිරීම භූගත ජල දත්ත රැස්කර පවත්වාගෙන යාම සහ භූජල සිතියම් පිළියෙල කිරීම

ආයතනික තොරතුරු

ආයතනය
ජල සම්පත් මණ්ඩලය

නෛතික තත්වය
රාජ්‍ය ව්‍යවස්ථාපිත මණ්ඩලයකි

ස්ථාපිත වර්ෂය
1966 දී 1964 අංක 29 දරණ පාර්ලිමේන්තු පනත මඟින්.

1999 දී, 1999 අංක 42 දරණ ජල සම්පත් මණ්ඩල (සංශෝධන) පනත මඟින් ඉහත පනත සංශෝධනය කරන ලදී.

ප්‍රධාන කාර්යාලය
අංක 02 ඒ,හෙක්ටර් කොබ්බෑකඩුව මාවත,
කොළඹ 07
දුරකථන : +94 11 2694835, +94 11 2697050
ෆැක්ස් : +94 11 2669517 (පාලන)
ඊමේල් : helpdesk@wrb.gov.lk
වෙබ් : www.wrb.gov.lk

රේඛීය අමාත්‍යාංශය
මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග හා ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය

බදු හඳුනාගැනීමේ අංකය
409018017

එ.අ.බ. ලියාපදිංචි අංකය
409018017 - 7000

බැංකුකරුවන්
ලංකා බැංකුව
ජාතික ඉතිරි කිරීමේ බැංකුව

ආදායම් බදු උපදේශක
ARS ඇසෝසියේට්
(වරලත් ගණකාධිකාරී)

විගණකවරුන්
විගණකාධිපති දෙපාර්තමේන්තුව
ප්‍රධාන අභ්‍යන්තර විගණක (මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග හා ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය)
අභ්‍යන්තර විගණක (ජල සම්පත් මණ්ඩලය)

අධ්‍යක්ෂක මණ්ඩලය
ආචාර්ය සේනක ද සිල්වා මහතා - සභාපති
පී.ජී.ඩී.එන්. ප්‍රේමලාල් මහතා - ක්‍රියාකාරී අධ්‍යක්ෂ
එම්.පී.එම්.ඩී.හේමකාන්ත මහතා - අධ්‍යක්ෂ
ජේ.ඒ.වී. වික්‍රමනායක මහතා - අධ්‍යක්ෂ
එස්.කේ.එන්.සමන්මලී මිය - භාණ්ඩාගාර නියෝජිත

ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන්
ජී.ආර්.ආර්.කරුණාරත්න මහතා
සාමාන්‍යාධිකාරී
පී.පී.එස්.ආර්.කේ.පතිරණ මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්)
එම්.ඒ.පුෂ්පකුමාර මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා මුදල්)
ඒ.බී.එම්.චන්ද්‍රසිරි මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්)
එම්.ජේ.දේශප්‍රිය මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු)
ආර්.එම්.එස්.රත්නායක මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (භූජල)
කේ.එම්.යු.සී.බී. කුලතුංග මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්)
ජේ. විජේසිරි මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (පාලන)
ඩී.ජී.එස්. වික්‍රම මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති)
ආර්.ආර්.ජී.ආර්. රාජපක්ෂ මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (පර්යේෂණ හා සංවර්ධන)

ආයතනික පාලන ව්‍යුහය

පෙර ගමන්කරුවන්

i.	ආචාර්ය සේනක ද සිල්වා මහතා	- සභාපති
ii.	පී.ජී.ඩී.එන්. ප්‍රේමලාල් මහතා	- ක්‍රියාකාරී අධ්‍යක්ෂ
iii.	එම්.පී.එම්.ඩී.හේමකාන්ත මහතා	- අධ්‍යක්ෂ
iv.	ජේ.ඒ.වී. වික්‍රමනායක මහතා	- අධ්‍යක්ෂ
v.	එස්.කේ.එන්.සමන්මලී මිය	- භාණ්ඩාගාර නියෝජිත

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

සමාලෝජිත වර්ෂය තුල අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් හයක් (06) පවත්වන ලදී.

විගණන හා කළමනාකරණ කමිටුව

i	ජේ.කේ.එන්. සමන්මලී මිය	- සභාපති	- භාණ්ඩාගාර නියෝජිත
ii	පී.ජී.ඩී.එන්. ප්‍රේමලාල් මහතා	- සාමාජික	- ක්‍රියාකාරී අධ්‍යක්ෂ
iii	පී.එච්. දීප්ති අනුරුද්ධිකා මිය	- සාමාජික	- ප්‍රධාන අභ්‍යන්තර විගණක (මහවැලි අමාත්‍යාංශය)
iv	ඩබ්ලිව්.එම්.කේ.අයි.සී. ප්‍රනාන්දු මහතා	- සාමාජික	- රජයේ විගණන අංශය
v	ජී.ආර්.ආර්. කරුණාරත්න මහතා	- ලේකම්	- සාමාන්‍යාධිකාරී

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්

2019 වර්ෂය තුල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් තුනක් (03) පවත්වන ලදී.

ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන් - 2019 වර්ෂය

i.	ජී.ආර්.ආර්. කරුණාරත්න මහතා	- සාමාන්‍යාධිකාරී
ii.	පී.පී.එස්.ආර්.කේ. පතිරණ මහතා	- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්)
iii.	එම්.ඒ. පුෂ්පකුමාර මහතා	- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා මුදල්)
iv.	ඒ.බී.එම්. චන්ද්‍රසිරි මහතා	- සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්)
v.	එම්.ජේ. දේශප්‍රිය මහතා	- සහකාර සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු)
vi.	ආර්.එම්.එස්. රත්නායක මහතා	- සහකාර සාමාන්‍යාධිකාරී (භූජල)
vii.	කේ.එම්.යු.සී.බී. කුලතුන්ග මහතා	- සහකාර සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්)
viii.	ජේ. විජේසිරි මහතා	- සහකාර සාමාන්‍යාධිකාරී (පාලන)
ix.	ආර්.ආර්.ජී.ආර්. රාජපක්ෂ මහතා	- සහකාර සාමාන්‍යාධිකාරී (පර්යේෂණ හා සංවර්ධන)
x.	ඩී.ජී.එස්. වික්‍රම මහතා	- සහකාර සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති)

වර්ෂය තුල භෞතික හා මූල්‍ය ප්‍රගතිය

වාණිජ අරමුදල් වල භෞතික ප්‍රගතිය - 2019

ක්‍රියාකාරකම්	දෙසැම්බර් දක්වා සමස්ථ ඉලක්ක (ප්‍රමාණය)	දෙසැම්බර් දක්වා සමස්ථ භෞතික ප්‍රගතිය (ප්‍රමාණය)
භූජල විද්‍යාත්මක සමීක්ෂණ සිදු කිරීම	500	461
නල ළිං ඉදිකිරීම	140	109
අත් පොම්ප සවි කිරීම	50	16
ජල ධාරිතා පරීක්ෂණ සිදු කිරීම	260	316
නල ළිං පිරිසිදු කිරීම	40	15
ජල සාම්පල විශ්ලේෂණය කිරීම	1000	514

වාණිජ අරමුදල්වල භෞතික ප්‍රගතිය



වාණිජ අරමුදල් වල මූල්‍ය ප්‍රගතිය - 2019

ක්‍රියාකාරකම්	අයවැය ගත රු.000	සත්‍ය
භූජල විද්‍යාත්මක සමීක්ෂණ සිදු කිරීම	20,000	26,051
නල ළිං ඉදිකිරීම	63,000	60,481
අත් පොම්ප සවි කිරීම	2,400	2,563
ජල ධාරිතා පරීක්ෂණ සිදු කිරීම	35,000	34,651
නල ළිං පිරිසිදු කිරීම	750	1,286
ජල සාම්පල විශ්ලේෂණය කිරීම	2,400	2,724

වාණිජ අරමුදල්වල මූල්‍ය ප්‍රගතිය



2019.12.31 දිනට කාර්යය මණ්ඩලය

වැටුප් තලය	අනුමත කාර්යය මණ්ඩලය ස්ථිර	වර්තමාන කාර්යය මණ්ඩලය ස්ථිර
HM	11	10
MM	47	29
JM	27	12
MA	92	45
PL	236	175
එකතුව	413	271



තනතුර	වැටුප් තලය	අනුමත සේවක මණ්ඩලය	වර්තමාන සේවක මණ්ඩලය	පුරප්පාඩු සංඛ්‍යාව
සාමාන්‍යාධිකාරී	HM	1		1
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී	HM	3	3	
සහකාර සාමාන්‍යාධිකාරී	HM	7	7	
පළාත් කළමනාකරු	MM	5	5	
භූජල විද්‍යාඥ/ ජ්‍යෙෂ්ඨ භූජල විද්‍යාඥ	MM	24	17	7
ඉංජිනේරු (යාන්ත්‍රික)	MM	1		1
ඉංජිනේරු (සිවිල්)	MM	2		2
රසඥ	MM	7	4	3
කළමනාකරු (විදුම්)	MM	3		3
අභ්‍යන්තර විගණක	MM	1	1	
ගණකාධිකාරී	MM	1		1
කළමනාකරු (පාලන)	MM	1		1
කළමනාකරු (ප්‍රසම්පාදන)	MM	1	1	
නීති නිලධාරී	MM	1		1
ජ්‍යෙෂ්ඨ ජල විශ්ලේෂක	JM 1-1	1	1	
පුද්ගලික සහකාර - සභාපති	JM 1-1	1	1	
පුද්ගලික සහකාර - සාමාන්‍යාධිකාරී	JM 1-1	1	1	
පාලන නිලධාරී	JM 1-1	2	1	1
ගිණුම් නිලධාරී	JM 1-1	1	1	
ප්‍රවාහන/ ප්‍රවර්ධන නිලධාරී	JM 1-1	1		1
පරිසර නිලධාරී	JM 1-1	1		1
විගණන නිලධාරී	JM 1-1	1	1	
පුස්ථකාලාධිපති	JM 1-1	1		1
තොරතරු තාක්ෂණ නිලධාරී	JM 1-1	1	1	
ඉංජිනේරු සහකාර (සිවිල්)	JM 1-1	4	2	2
ඉංජිනේරු සහකාර (යාන්ත්‍රික)	JM 1-1	2		2
ගබඩා අධිකාරී	JM 1-1	1	1	
ප්‍රසම්පාදන නිලධාරී	JM 1-1	1		1
විදුම් අධිකාරී	JM 1-1	6	1	5
ප්‍රගති අධීක්ෂණ නිලධාරී	JM 1-1	1		1
සැලසුම් නිලධාරී සහකාර	JM 1-1	1	1	
තාක්ෂණික සහකාර (සිවිල්)	MA 2-2	7	2	5
තාක්ෂණික සහකාර (යාන්ත්‍රික)	MA 2-2	6	1	5
සහකාර විදුම් අධිකාරී	MA 2-2	14	8	6
සැලසුම් ශිල්පී	MA 2-2	4		4
ජල විශ්ලේෂක	MA 2-2	10	2	8
වැඩ පරීක්ෂක	MA 2-2	2		2
වැඩබිම් පරීක්ෂක	MA 2-2	2		2
පද්ධති ක්‍රියාකරු	MA 2-2	1		1
ගිණුම් සහකාර	MA 2-2	2	2	
ගබඩා භාරකරු	MA 2-2	3	1	2
තොරතුරු තාක්ෂණ ශිල්පී	MA 2-2	1		1
කළමනාකරණ සහකාර	MA 2-1	2	2	
කළමනාකරණ සහකාර	MA 1-2	37	27	10
ආරක්ෂක නිලධාරී/ සහකාර	MA 1-2	1		1
විදුම් යාන්ත්‍රික ශිල්පී රියදුරු	PL 3	7		7
මේසන්	PL 3	3	2	1
ජල නල කාර්මික	PL 3	4		4
රියදුරු	PL 3	50	37	13
වැද්දුම් ශිල්පී/ පැස්සුම් ශිල්පී	PL 3	3	2	1
මෝටර් කාර්මික	PL 3	2	1	1
පට්ටල්කරු/පැස්සුම් ශිල්පී	PL 3	1	1	
විදුලි කාර්මික	PL 3	1	1	
මෝටර් විදුලි කාර්මික	PL 3	1		1
තහඩු වැඩ ශිල්පී / පින්තාරු ශිල්පී	PL 3	2		2
බර යන්ත්‍ර ක්‍රියාකරු	PL 3	2		2
විදුම් යන්ත්‍ර ක්‍රියාකරු සහ රියදුරු	PL 3	7	3	4
විදුම් සහයක	PL 2	7	1	6
නඩත්තු සහයක	PL 2	3	1	2
සංචාරක නිවාස භාරකරු	PL 2	1	1	
කම්කරු	PL 1	105	104	1
කාර්යාල සහයක	PL 1	23	10	13
ආරක්ෂක නිලධාරී	PL 1	14	12	02
එකතුව		413	271	142

වටිනාකමින් වැඩි වත්කම් වාහන, යන්ත්‍ර සහ උපකරණ

වර්ගය	ප්‍රමාණය	වටිනාකම රු.
වාහන		
ඩබල් කැබ්	16	56,900,000.00
ලොරි	17	71,020,625.00
මෝටර් රථ	02	1,900,000.00
ජීප්	02	400,000.00
සිංගල් කැබ්	01	150,000.00
ත්‍රී රෝද රථ	01	225,000.00
එකතුව	39	130,595,625.00
යන්ත්‍රෝපකරණ		
විදුම් යන්ත්‍ර	16	73,000,000.00
වායු පීඩන යන්ත්‍ර (ලොරි රථයට සම්බන්ධ කල)	12	81,100,000.00
පොම්ප ඒකක	03	18,800,000.00
එකතුව	31	172,900,000.00
විද්‍යාත්මක උපකරණ		
ප්‍රතිරෝධකතා මීටර	11	32,631,500.00
භූ භෞතික දත්ත ලබා ගැනීමේ උපකරණ	02	14,166,900.00
DGPS	01	2,000,000.00
එකතුව	14	48,798,400.00
රසායනාගාර උපකරණ		
Atomic Absorption Spectro Unit	03	3,000,000.00
pH Meter	18	1,409,454.40
Flame Photometer	03	1,930,000.00
එකතුව	24	6,339,454.40

ප්‍රධාන ක්‍රියාකාරකම්

නල ළිං ඉදිකිරීම





ජල ධාරිතා පරීක්ෂණ





භූජල සමීක්ෂණ



ජල සාම්පල පරීක්ෂාව



ජල සම්පත් මණ්ඩලය විසින්

2019 වර්ෂයේදී ක්‍රියාත්මක කරනු ලැබූ

මෙහෙයුම් කාර්යයන්

වර්ෂය තුල භෞතික හා මූල්‍ය ප්‍රගතිය

(01) භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක භූගත ජල නිමාන ව්‍යාපෘති සහ අධ්‍යයන

1.1 භූගත ජල කළමනාකරණයට අවශ්‍ය දිගු කාලීන දත්ත එක් රැස් කිරීම සඳහා වූ වැඩසටහන (රු. මිලියන 2.0)

මූලික ක්‍රියාකාරකම් අවසන් කොට ඇති ව්‍යාපෘති 08 ක් ඒකාබද්ධ කොට මෙම දිස්ත්‍රික්කයේ සිදුකරගෙන යනු ලබන අතර මෙහිදී අදාල ව්‍යාපෘති ප්‍රදේශ තුල දීර්ඝකාලීන භූගත ජල අධ්‍යයනය සිදු කෙරේ. මූලික ව්‍යාපෘති ආරම්භයේදී, එම ව්‍යාපෘති වලට අදාල ප්‍රදේශ වල පවතින භූගත ජල ගැටළු හඳුනාගනිමින් දීර්ඝකාලීන නිමාන පද්ධතිය භූගත ජල අධීක්ෂණ දත්ත එක් රැස් කිරීමේ ජාලය නල ළිං සහ වල ළිං ජාලය සකස් කිරීම සඳහා පරීක්ෂණ නල ළිං ඉදිකරන ලදී. එම ඉදිකරන ලද නල ළිං වල විස්තර පහත පරිදි වේ.

අනු අංකය	ව්‍යාපෘතියේ නම	ප්‍රදේශය	ඉදි කරන ලද පරීක්ෂණ නල ළිං ගණන
01.	කොළඹ සිට මීගමුව දක්වා දිවෙන වැලි සහිත නොගැඹුරු ජල ධරය පිළිබඳව සිදු කරන සවිස්තරාත්මක භූජල විද්‍යාත්මක අධ්‍යයනය	කොළඹ සිට මීගමුව දක්වා වෙරල ආශ්‍රිතව ඇති වැලි තීරුව	78
02.	පුත්තලම ආශ්‍රිතව සිදු කරන භූජල විද්‍යාත්මක අධ්‍යයනය	කැළණි ගංගා ද්‍රෝණිය	14
03.	කැළණි ගංගා ද්‍රෝණිය	කැළණි ගංගා ද්‍රෝණිය	25
04.	අනුරාධපුර දිස්ත්‍රික්කය තුල සිදු කරන දීර්ඝ කාලීන භූ ජල විද්‍යා අධ්‍යයනය	අනුරාධපුර දිස්ත්‍රික්කය	32
05.	වව්නියා-කිලිනොච්චි ප්‍රදේශ ආවරණය කරමින් සිදු කරන භූ ජල විද්‍යාත්මක අධ්‍යයනය	වව්නියා-කිලිනොච්චි ප්‍රදේශය	35
06.	මන්නාරම දිස්ත්‍රික්කයේ පවතින හුණු ගල් සහිත ජලධරය පිළිබඳව සිදු කරන භූ ජල විද්‍යාත්මක අධ්‍යයනය	මන්නාරම දිස්ත්‍රික්කය	55
07.	කිරිඳි ඔය ජල ද්‍රෝණියේ පහළ ජල ධර ප්‍රදේශය භූජල අධ්‍යයනය	කිරිඳි ඔය ද්‍රෝණිය	25
08.	යාපන අර්ධද්වීපයේ ජලධරය පිළිබඳව සිදු කරන භූ ජල විද්‍යාත්මක අධ්‍යයනය	යාපන අර්ධද්වීපය	74

මෙම ව්‍යාපෘතියේ වත්මන් ක්‍රියාකාරකම් වනුයේ ජල සාම්පල එක්රැස් කිරීම, භූගත ජල මට්ටම් පරීක්ෂා කිරීම හා ජල සාම්පල රසායනික විශ්ලේෂණය සිදු කිරීමය.

2019 වර්ෂය සඳහා අපේක්ෂිත ඉලක්කය හා සමස්ත ප්‍රගතිය පහත පරිදි වේ.

අනු අංකය	ක්‍රියාකාරකම	2019 වර්ෂයේ ඉලක්කය	2019 වර්ෂයේ ප්‍රගතිය
01.	ජල සාම්පල එක්රැස් කිරීම හා ජල මට්ටම් මිනුම් ගැනීම	1000	100%
02.	ජල සාම්පල රසායනික විශ්ලේෂණය	750	79%



රූප සටහන1: අධ්‍යයන ප්‍රදේශ



රූප සටහන 2 : භූගත ජල නිමනය හා ජල සාම්පල එක්රැස් කිරීම

1.2 කාලගුණික විපර්යාස නිසා භූගත ජලයට ඇති විය හැකි සෘජු හා වක්‍ර බැලපෑම පිළිබඳ අධ්‍යයනය (රු. මිලියන 1.4)

මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ ගෝලීය කාලගුණික හා දේශගුණික වෙනස් වීම නිසා දිවයිනෙහි මුහුදු බඩ ජල ධරයන්හි ගුණාත්මක බව විචලනය වීම සහ ලවන සහිත ජලය ගොඩබිමට ඇතුළු වීමේ ප්‍රවනතාවය දීර්ඝ කාලීනව නිරීක්ෂණය කොට එම ජල ධරයන් කළමනාකරණය කිරීමට අවශ්‍ය භූගත ජල දත්ත එක්රැස් කිරීම. මෙම ඉහත අරමුණ සපුරාලීම පිණිස පහත සඳහන් ක්‍රියාකාරකම් මෙම වර්ෂයේදී සිදු කරන ලදි.

■ වෙරළාසන්න භූගත ජලධර - කොළඹ සිට වැලිගම දක්වා හා ඊසාන දිග වෙරළ තීරය

මෙම අධ්‍යයනය 2014 වර්ෂයේ ආරම්භ කරන ලද අතර 2017 වර්ෂය දක්වා නිරීත දිග ප්‍රදේශ ආශ්‍රිතව වැලිගම සිට කළුතර දක්වා මුහුදු බඩ ජල ධරයන්හි පර්යේෂණ නල ලිං 10ක් පමණ ද ත්‍රිකුණාමලය හා මුලතිව් දිස්ත්‍රික්කයේ නල ලිං 25ක් පමණද ඉදිකරන ලද අතර ඒවා ආශ්‍රිතව භූගත ජල මට්ටම් මිනුම් ගත කිරීම, ජල සාම්පල එක් රැස් කිරීම, ඒවා රසායනිකව විශ්ලේශණය කිරීම සිදු කරන ලදි. මෙහිදි කොග්ගල වෙළඳ කලාපය සහ ගුවන් තොටුපලෙහි ඉදි කොට ඇති පැරණි නල ලිං උපයෝගී කොට ගන්නා ලදි. බටහිර වෙරළ තීරයෙහි දත්ත එක්රැස් කිරීමේ ස්ථාන රූපය තුන 3 - 1 මඟින් දැක්වෙන අතර මුලතිව්, ත්‍රිකුණාමල හා මඩකළපු දිස්ත්‍රික්ක උපයෝගි කර ගන්නා නල ලිං 3 - 2 මඟින් දැක්වේ. දත්ත එක්රැස් කිරීම මෝසම් වැසි වලට පෙර සහ පසු ලෙස වසර තුල අවස්ථා 4කදී දත්ත එක්රැස් කරන අතර ඒ අනුව 2019 වර්ෂයට අදාල ක්‍රියාකාරකම් සම්පූර්ණයෙන් අවසන් කරන ලදී.

මේ අනුව කොළඹ සිට වැලිගම දක්වා දිවෙන බස්නිහිර වෙරළ තීරයේ දීර්ඝ කාලීන අධ්‍යයන සඳහා තෝරා ගන්නා ලද නොගැඹුරු ළිං 46කදි හා ඊසාන දිග වෙරළ තීරයේ දීර්ඝ කාලීන අධ්‍යයන සඳහා තෝරා ගන්නා ලද නොගැඹුරු ළිං 35 ක් (2019 වර්ෂයේ භූ ජල සමීක්ෂණ සිදුකර ඉදිකරන ලද නොගැඹුරු ළිං 10 ද ඇතුලත්ව) උපයෝගී කරගෙන ජල මට්ටම් මැනීම හා ජල නියැදි එකතු කිරීම සිදු කරන ලදී. (මුළු නියැදි ගණන 81) එකතු කරන ලද ජල නියැදි රසායනික විශ්ලේෂණයට භාජනය කරන ලදි. එහිදි අවස්ථා දෙකකදි

ක්ෂේත්‍රයේදී ජලයේ ගුණාත්මකභාවයත් පරාමිතීන් හතරක් (PH, TDS, Salinity) මනින ලදී. අවස්ථා දෙකකදී ජල සාම්පල රසායනික පරීක්ෂණ සඳහා එක්රැස් කරන ලදී.



රූප සටහන 3 - 1:
කොළඹ සිට වැලිගම දක්වා භූගතජලය එක්රැස් කිරීමේ ස්ථාන



රූපසටහන 3 - 2
මුලතිවු සිට මඩකලපුව දක්වා භූගත ජලය එක්රැස් කිරීමේ ස්ථාන

1.3 වකුගඩු ආශ්‍රිත රෝග පවතින දිස්ත්‍රික්කවල ජලයේ ගුණාත්මක අධ්‍යයනය (රු. මිලියන 1.9)

මෙම ව්‍යාපෘතිය 2014 වර්ශයේ ආරම්භ කොට වකුගඩු රෝග ආශ්‍රිත මොනරාගල, අම්පාර, කුරුණෑගල, පුත්තලම, අනුරාධපුර, ත්‍රිකුණාමලය සහ පොළොන්නරුව දිස්ත්‍රික්ක ආවරණය කරන පරිදි භූගත ජලයේ ගුණාත්මක තත්වයන් වෙනස්වීම් අධ්‍යයනය කිරීම හා පානීය ජලය ලෙස භාවිතා කරන ජල ප්‍රභව හඳුනාගැනීම මගින් වකුගඩු රෝග පැතිරීම අවම කිරීම සඳහා අවශ්‍ය දත්ත රැස්කිරීම.

2019 වර්ෂයේ පහත ක්‍රියාකාරකම් ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කරන ලදී.

අනු අංකය	ක්‍රියාකාරකම	2019 වර්ෂයේ ඉලක්කය	2019 වර්ෂයේ ප්‍රගතිය
01.	ජල සාම්පල රැස් කිරීම සහ ජල මට්ටම් මැනීම	1000	1000
02.	දැනුවත් කිරීමේ වැඩසටහන්	05	1
03.	ජල සාම්පල් විශ්ලේෂණය	1000	49%



රූප සටහන 4 : ජල සාම්පලරැස් කිරීම සහ ජල මට්ටම් මැනීම

1.4 හදිසි ආපදා අවස්ථා වල අවශ්‍යතා සඳහා භූගත ජලය සංවර්ධනය කිරීම (රු. මිලියන 4.0).

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වියළි කාලගුණික නිසා ජල හිඟය පවතින ප්‍රදේශයන්හි හදිසි අවශ්‍යතාවයන්ට භූගත ජලය සම්පාදනය කිරීම. 2019 වර්ෂයේ පහත සඳහන් ක්‍රියාකාරකම් වවුනියාව, මොනරාගල, පුත්තලම, මහනුවර, ගම්පහ, පොළොන්නරුව, අනුරාධපුර සහ මාතලේ දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි සිදු කරන ලදි.

අනු අංකය	ක්‍රියාකාරකම	වාර්ෂික ඉලක්ක	2019 වර්ෂයේ ප්‍රගතිය
01.	භූ සමීක්ෂණ සිදු කිරීම	30	30
02.	නල ලිං ඉදි කිරීම	30	22
03.	පොම්ප පරීක්ෂණ පැවැත්වීම	10	05
04.	ජල රසායනික විශ්ලේෂණය	10	22
05.	දත්ත විශ්ලේෂණය සහ වාර්තා කිරීම	අවසන් කර ඇත.	අවසන් කර ඇත.







රූප සටහන් 5 සහ 6 : භූ සමීක්ෂණ සිදු කිරීම හා නල ලිං ඉදි කිරීම

1.5 වියළි කාලාපයේ ප්‍රදේශය වල පැරණි අත් පොම්ප නල ළිං පුනුරුත්තාපනය කිරීමේ වැඩසටහන (රු. මිලියන 1.2)

මොනරාගල, පුත්තලම සහ අනුරාධපුර දිස්ත්‍රික්කවල දැඩි ලෙස ජල හිඟයට මුහුණදී පවතින ග්‍රාමීය ප්‍රදේශවල අවශ්‍යයෙන් භාවිතයට ගතයුතු පැරණි අර්ධ ලෙස හානි වූ හා සම්පූර්ණයෙන් අබලන් නල ලිං පුනුරුත්තාපනය කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය සිදු කරන ලදී.

2019 වර්ෂයේ පහත සඳහන් ක්‍රියාකාරකම් නිමවා ඇත.

අනු අංකය	ක්‍රියාකාරකම	වාර්ෂික ඉලක්ක	2019 වර්ෂයේ ප්‍රගතිය
01.	අත්පොම්ප අලුත්වැඩියා කිරීමහා විදුලි යන්ත්‍ර යොදවා පැරණි නල ලිං පිරිසිදු කිරීම	100	54



රූප සටහන 7 සහ 8 : අත් පොම්ප නළ ලිං ප්‍රතිසංස්කරණය කිරීම හා නළ ලිං පිරිසිදු කිරීම



රූප සටහන 9 : ග්‍රාමීය ජනතාව ප්‍රතිසංස්කරණය කරන ලද නළ ලිං භාවිතයට ගැනීම.

1.6 භූගත ජලයට අදාල පාරිසරික ගැටළු විසඳීමට අවශ්‍ය ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂණ සිදුකිරීම (රු. මිලියන 0.5)

පස්, බොරළු, මැටි, වැලි කැණීම හා ගල් කැඩීම නිසාත්, භූගත ජලය අධික ලෙස ළිං වලින් පොම්ප කිරීම නිසාත් ඇතිවන භූගත ජල මට්ටම්වල අඩුවීම හා ජල දූෂණය යන පාරිසරික වෙනස්වීම් අධ්‍යයනය මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ.

මධ්‍යම පරිසර අධිකාරිය, භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, වයඹ පළාත් පරිසර අධිකාරිය හා අනෙකුත් සම්බන්ධිත ආයතනයන් හා මනා සම්බන්ධීකරණය සහිතව මෙම අධ්‍යයන හා නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

මේ යටතේ පුත්තලම, කොළඹ, ගම්පහ, කුරුණෑගල, අනුරාධපුරය, මොණරාගල, කෑගල්ල, මහනුවර, නුවරඑළිය, රත්නපුර හා කළුතර දිස්ත්‍රික්කවල සමීක්ෂණ කටයුතු සිදු කරන ලදී.

අනු අංකය	ක්‍රියාකාරකම	වාර්ෂික ඉලක්ක	2019 වර්ෂයේ ප්‍රගතිය
01.	ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂණ හා පාරසරික ගැටළු වලට අදාල රැස්වීම් සඳහා සහභාගි වීම්.	100	119
02.	වාර්ථා සකස් කිරීම්.	100	119



රූප සටහන 10: ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කිරීම

1.7 කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් (රු. මිලියන 5.0)

ජල සම්පත් මණ්ඩලයේ කාර්යය මණ්ඩලයේ හැකියාව වර්ධනය කිරීම නව දැනුමක් ලබා දීම සඳහා 2019 වර්ෂයේදී විවධ ක්ෂේත්‍ර වල නිරත කාර්යය මණ්ඩල සඳහා පුහුණු වැඩසටහන් 19ක් සංවිධානය කරන ලදී. ඒ සඳහා ජල සම්පත් මණ්ඩලයේ සේවක මහත්ම මහත්මීන් 82 දෙනෙකු සහභාගී විය.

අනු අංකය	විස්තරය	සංඛ්‍යාව
01.	පුහුණු වැඩමුළු	19
02.	සහභාගි වූ මුළු කාර්යය මණ්ඩලය	82

1.8 ජල සම්පත් මණ්ඩලයේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම (රු. මිලියන 5.5)

ඉහත වැඩසටහන යටතේ මොණරාගල, පුත්තලම හා අනුරාධපුර පළාත් කාර්යාලවල පහත වගුවේ දක්වා ඇති පරිදි අදාල වැඩසටහන් සිදුකරන ලදී.

අනු අංකය	ක්‍රියාකාකරම	වර්ෂික ඉලක්කය	වර්ෂයේ ප්‍රගතිය
01.	මොණරාගල පළාත් කාර්යාලයේ සේවක නිවස්නය ඉදිකිරීම	සේවක නිවස්නය	85 %
02.	මොණරාගල පළාත් කාර්යාලයේ වහල අලුත් වැඩියා කිරීම	කාර්යාලයේ වහල	100 %
03.	පුත්තලම පළාත් කාර්යාලයේ ගබඩාව ඉදිකිරීම	ගබඩාව	100 %
04.	අනුරාධපුර පළාත් කාර්යාලයේ වැට ප්‍රතිසංස්කරණ කිරීම	වැට ප්‍රතිසංස්කරණ	100 %



සටහන 11: මොණරාගල පළාත් කාර්යාලයේ වහල හා පුත්තලම පළාත් කාර්යාලයේ ගබඩාව ඉදිකිරීම



12: මොණරාගල පළාත් කාර්යාලයේ සේවක නිවස්නය ඉදිකිරීම හා අනුරාධපුර පළාත් කාර්යාලයේ වැට ප්‍රතිසංස්කරණ කිරීම

(02) අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ සිදු කරන භූගත ජල සංවර්ධන ව්‍යාපෘතිය

2.1 යාපනය දිස්ත්‍රික්කයේ භූගත ජල කළමනාකරණ හා සංරක්ෂණ සැලැස්ම සකස් කිරීම (රු.මිලියන 7.0)

යාපනය දිස්ත්‍රික්කය සඳහා භූගත ජල කළමනාකරණ සැලැස්මක් සකස් කිරීමේ අරමුණ ඇතිව ක්‍රමවත් විද්‍යාත්මක භූජල අධ්‍යයනයක් ජල සම්පත් මණ්ඩලය මගින් අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ 2017 වර්ෂයේදි ආරම්භ කරන ලදී. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා තෝරාගත් උසස් අධ්‍යාපන අවසන් කරන ලද සිසුන් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරි මහතුන් සහභාගි කරගනු ලැබූ අතර එයට අදාල දැනුවත් කිරීම් හා භාවිතා කරනු ලබන ක්ෂේත්‍ර කටයුතු සඳහා භාවිතා කරන උපකරණ පිළිබඳ දැනුවත් කිරීම සිදු කරන ලදි. එසේම මෙම ව්‍යාපෘතිය යටතේ 2019 වර්ෂයේද යාපනය දිස්ත්‍රික්කයේ පවතින සියලුම ලිං ඉන්වෙන්ට්‍රි ගත කිරීම ආරම්භ කරන ලදී.

යාපන අර්ද්ධවීපයේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස 15ක සිදුකරන ලද නිමාන කටයුතු ලිං සංඛ්‍යාව පහත වගුවේ දක්වා ඇත.

අනු අංකය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	ග්‍රාම නිලධාරි වසම් ගණන	නිමාන කළයුතු කළ ග්‍රාම නිලධාරී වසම් ගණන	නිමාන කටයුතු කළ ලිං සංඛ්‍යාව
01	කරෛයිනගර්	09	06	1,800
02	සන්දිලිපෙයි	28	28	17,797
03	තෙලිප්පලායි	43	43	19,478
04	උඳුවිල්	30	26	14,620
05	යාපනය	28	18	6,088
06	වෙලනෙයි	30	09	3,340
07	නල්ලූර්	40	13	6,720
08	කයිට්ස්	15	07	840
09	ඩෙල්ෆ් දූපත	06	05	450
10	මරුත්තන්කනෙයි	17	04	400
11	චාවකච්චේරි	60	52	12,960
12	කරවඩෙයි	35	05	806
13	චන්කනායි	25	10	469
14	කොපෙයි	31	12	14,260
15	පොයින් පේදුරු	35	12	5,436
			එකතුව	105,464



රූපසටහන 13: භූජල අධ්‍යයනය සිදුකිරීම හා දත්ත රැස් කිරීම

2.2 යාන් ඔය වාරිමාර්ග ව්‍යාපාතිය ආශ්‍රිත ප්‍රදේශවල නොගැඹුරු භූගත ජලධර වල ජල මට්ටම් වෙනස්වීම හා ජලයේ ගුණාත්මක භාවය අධ්‍යයනය (රු.මිලියන 1.0)

යෝජිත යාං ඔය හා මල්වතු ඔය වාරිමාර්ග ව්‍යාපෘති ආශ්‍රිත ප්‍රදේශවල නොගැඹුරු භූගත ජලයේ ගුණාත්මකභාවය වෙනස් වීම හා ප්‍රමාණාත්මකභාවය අධ්‍යයනය මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වේ.

මෙම ව්‍යාපෘතිය යටතේ 2019 වර්ෂයේ ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ.

අනු අංකය	ක්‍රියාකාරකම්	වාර්ෂික ඉලක්කය	2019 වර්ෂයේ ප්‍රගතිය
01	ජල ධාරිතා පරීක්ෂණ	05	05
02	ජල සාම්පල එක් රැස් කිරීම හා ජල මට්ටම් මැණිම	600	90%
03	ජල සාම්පල් විශ්ලේශණය	100	35%
04	දත්ත විශ්ලේශණය හා වාර්තා සැකසීම	සිතියම් හා වාර්ථාව	සකසමින් පවතී

2.3 මල්වතු ඔය වාරිමාර්ග ව්‍යාපාතිය ආශ්‍රිත ප්‍රදේශවල නොගැඹුරු භූගත ජලධර වල ජල මට්ටම් වෙනස්වීම හා ජලයේ ගුණාත්මක භාවය අධ්‍යයනය (රු. මිලියන 2.0)

යෝජිත යාං ඔය හා මල්වතු ඔය වාරිමාර්ග ව්‍යාපෘති ආශ්‍රිත ප්‍රදේශවල නොගැඹුරු භූගත ජලයේ ගුණාත්මකභාවය වෙනස් වීම හා ප්‍රමාණාත්මකභාවය අධ්‍යයනය මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වේ.

මෙම ව්‍යාපෘතිය යටතේ 2019 වර්ෂයේ ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ.

අනු අංකය	ක්‍රියාකාරකම්	වාර්ෂික ඉලක්කය	2019 වර්ෂයේ ප්‍රගතිය
01	ජල ධාරිතා පරීක්ෂණ	05	05
02	ජල සාම්පල එක් රැස් කිරීම හා ජල මට්ටම් මැණිම	600	94%
03	ජල සාම්පල් විශ්ලේශණය	100	71%
04	දත්ත විශ්ලේශණය හා වාර්තා සැකසීම	සිතියම් හා වාර්ථාව	10%

(03) උප්පාදිත අරමුදල් ඉපැයීම සඳහා සිදු කරන ලද වානිජ්‍ය ක්‍රියාකාරකම්

පහත සඳහන් වානිජ්‍ය ක්‍රියාකාරකම් මණ්ඩලය මඟින් 2019 වර්ෂයේ සිදු කොට ඇත. මෙම ක්‍රියාකාරකම් රජය සහ රජය නොවන ආයතනද ජනතාවගේ පෞද්ගලික ඉල්ලිම් මත මණ්ඩලය මඟින් ඇස්තමේන්තු කොට වානිජ්‍ය මට්ටමින් සිදු කරනු ලැබේ.

අනු අංකය	ක්‍රියාකාකරම්	ප්‍රමාණය
01	භූ සමීක්ෂණ	460
02	නල ලිං ඉදි කිරීම	117
03	අත් පොම්ප ඉදි කිරීම	16
04	ජල ධාරිතා පරීක්ෂණ සිදු කිරීම	317
05	නල ලිං පිරිසිදු කිරීම	15
06	ජල රසායනික විශ්ලෙග්ෂණය	510

(04) භූ ගත ජලය නියාමනයට අදාල රෙගුලාසි ක්‍රියාත්මක කිරීම.

2017 මාර්තු 16 දිනැති අංක 2010/23 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් භූගත ජලය භාවිතය නියාමනය කිරීමට අදාල ජල සම්පත් මණ්ඩලය වෙත පවරා ඇති වගකීම ඉටු කිරීමට 2019 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකරකම් වල වැඩසටහන් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

අනු අංකය	ක්‍රියාකාකරම්	ප්‍රමාණය
01	පුද්ගලික නල ලිං ආයතන ලියාපදිංචි කිරීම.	117
02	පුද්ගලික විදුම් යන්ත්‍ර සඳහා ලියාපදිංචි සහතික ලබාදීම.	165
03	වාණිජමය වශයෙන් භූගත ජලය භාවිතා කරන ආයතන ලියාපදිංචි කිරීම. (ගැඹුරු හා නොගැඹුරු නල ලිං හා වල ලිං භාවිතයෙන් වාණිජ කටයුතු සඳහා ජලය ලබා ගන්නා ආයතන)	55
04	පුද්ගලික විදුම් යන්ත්‍ර ක්ෂේත්‍රයෙදී පරීක්ෂා කිරීම්.	136
05	වාණිජමය වශයෙන් නල ලිං හා වල ලිං භාවිතා කරමින් වාණිජමය වශයෙන් ජලය ලබා ගන්නා ලිං සඳහා ජල මනු සවි කිරීම. මෙමගින් භූගත ජල පරිභෝජනය නිමානය කිරීම සිදු කරනු ලැබේ.	24
06	භූගත ජලය වාණිජමය හා අනෙකුත් කටයුතු සඳහා ලබා ගැනීම මඟින් ඇතිවන ගැටළු පිළිබඳ පැමිණෙන පැමිණිලි පිළිබඳ විමර්ශන කිරීම සඳහා ඒකාබද්ධ ක්ෂේත්‍ර කටයුතු සිදු කිරීම හා උසාවි කටයුතු.	26
07	ජල සම්පත් මණ්ඩලයේ ලියාපදිංචි වී ඇති පුදගලික භූජල විද්‍යාඥයින් මඟින් ජල සම්පත් මණ්ඩලය වෙත එවන ලද වාර්තා අනුමත කිරීම.	1473

2019 වර්ෂයේ රසායනාගාර ප්‍රගතිය

2019 වර්ෂයේ රසායනාගාරයන්හි ප්‍රගතිය හා ජල විෂ්ලේෂණය පිළිබඳ විස්තරය පහත පරිදි වේ.

ජල සාම්පල විෂ්ලේෂණය

අනු අංකය	විෂ්ලේශණ වර්ගය	ජල නියැදි ප්‍රමාණය	ප්‍රමාණය
01	රසායනික හා භෞතික පරීක්ෂණ (ව්‍යාපෘති නොවන)	367 (කොළඹ, පුත්තලම, අනුරාධපුරය, යාපනය)	1,491,157.00
02	ක්ෂුද්‍රජීවී පරීක්ෂාව (ව්‍යාපෘති නොවන)	94 (කොළඹ, පුත්තලම, අනුරාධපුරය, යාපනය)	235,000.00
03	රසායනික හා ක්ෂුද්‍රජීවී පරීක්ෂාව (භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති)	1945 (කොළඹ, පුත්තලම, අනුරාධපුරය, යාපනය)	Projects
	මුලු ආදායම	භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති හැර	1,726,157.00

ජල සාම්පල විෂ්ලේශණය පිළිබඳ විස්තරය

1. රසායනික හා ක්ෂුද්‍රජීවී පරීක්ෂාව

ජල සම්පත් මණ්ඩලයට අයත් රසායනාගාර 4න් (කොළඹ, පුත්තලම, අනුරාධපුර, යාපනය) 2019 වර්ෂයේ ව්‍යාපෘති නොවන (Commercial) ජල සාම්පල 367ක්, සඳහා රසායනික හා භෞතික පරීක්ෂාව ද ජල සාම්පල 94ක් ක්ෂුද්‍ර ජීවී පරීක්ෂාවද සිදුකරන ලදි. එසේම භාණ්ඩාගාරික ප්‍රතිපාදන යටතේ ජල සම්පත් මණ්ඩලය මගින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති මගින් ලැබුනු ජල සාම්පල 1945ක් රසායනික හා ක්ෂුද්‍රජීවී පරීක්ෂාව සිදු කරන ලදි. ව්‍යාපෘති නොවන (Commercial) ජල සාම්පල විශ්ලේෂණය කිරීමෙන් රසායනාගාරය ලද ආදායම රු. මිලියන 1.7ක් විය.



රූපය : ISO තත්ව සහතිකය ලත් රසායනාගාරය



රූපය : 1.1 ශ්‍රී ලංකා ප්‍රතිතන ආයතනය (ISO) මගින් සිදුකරන ලද තත්ව විගනන පරීක්ෂාව

1. බැර ලෝහ පරීක්ෂාව (ආසනික්, කැඩ්මියම්, ක්‍රෝමියම්, ලෙඩ්, මැංගනීස්, සොඩියම්, පොටෑසියම්, සිනික්)

බැර ලෝහ විෂ්ලේෂණය සඳහා ව්‍යාපෘති සහ පුද්ගලික අංශ වලින් ජල සාම්පල ජල සම්පත් මණ්ඩලයේ රසායනාගාර වෙත ලැබේ.



රූපය 3: බැර ලෝහ විශ්ලේෂණය කිරීමේ උපකරණය.

3. රසායනාගාරවල තත්වය ඉහල නැංවීම සඳහා සිදුකල කාර්යයන් :

ජාත්‍යන්තර වශයෙන් පිලිගත් ISO 17025 :2005 තත්ව සහතිකය ශ්‍රී ලංකා ප්‍රතීතන ආයතනය (SRI LANKA ACCREDITATION BOARD) මගින් ජල සම්පත් මණ්ඩලයේ කොළඹ පිහිටි රසායනාගාරය වෙත පිරිනමා ඇත.

SLAB
SRI LANKA
ACCREDITATION BOARD

Certificate of Accreditation

Sri Lanka Accreditation Board for Conformity Assessment
hereby declares that

Chemical and Microbiology Laboratory
Water Resources Board

having being found to comply with the accreditation criteria for testing/calibration laboratories as described in ISO / IEC 17025 :2005, has been accredited as a testing laboratory under the field of

Chemical Testing

and has been assigned the accreditation number

TL 065-01

This certificate is issued on 12 October 2016 and is valid until

11 October 2019

The accreditation was granted for the first time on 12 October 2016

The scope and conditions of accreditation are specified in the Schedule of Accreditation bearing the accreditation number appearing in this certificate.

Deputy Director (Accreditation)
Sri Lanka Accreditation Board for Conformity Assessment
Colombo, Sri Lanka


මූල්‍ය ප්‍රකාශන

පටුන	සටහන් අංක	ප්‍රමාණය
මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය	-	01
මූල්‍ය තත්ව ප්‍රකාශනය	-	02
ශුද්ධ වත්කම් / ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය	15	03
මුදල් ප්‍රවාහ ප්‍රකාශය	-	05
භාණ්ඩාගාර ප්‍රතිපාදන නිදහස් කිරීම් සැසඳුම	-	06-09
ගිණුම්කරණ ප්‍රතිපත්ති	01-03	10-11
මෙහෙයුම් කටයුතු වලින් ලද ආදායම	04.01 - 04.04	12-13
මෙහෙයුම් කටයුතු සඳහා වියදම	01.05	13
වෙනත් ව්‍යාපෘති වියදම්	01.06	14
භාණ්ඩාගාර ප්‍රතිපාදන වැය - ප්‍රාග්ධන	05	14
මුදල් හා මුදල් සමාන දෑ	6	15
වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ	07	15
තොග හා අමතර කොටස්	08	15
ඉදිරියට කල ගෙවීම්	9	16-17
දේපළ, පිරියත උපකරණ	10	18
වෙළඳ ණයහිමියෝ	11	18
වෙනත් වෙන් කිරීම් හා ගෙවිය යුතු දෑ	12	18
විලම්භිත ආදායම්	13	19-20
සේවක විශ්‍රාම ප්‍රතිලාභ	14	21
විලම්බිත ආදායම්	-	22
උපචිත වියදම්	-	29-25
ණය සඳහා උපලේඛනය	-	26
නයගැති උපලේඛණය	-	27-29
සේවා අත්තිකාරම් උපලේඛනය		

ජල සම්පත් මණ්ඩලය

මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සත්‍ය - 2019 රු.000'	සත්‍ය - 2018 රු.000'	අයවැයගත - 2019 රු.000'
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ආදායම්	135,967	188,556	132,950
භාණ්ඩාගාර ප්‍රතිපාදන - පුනරාවර්තන	180,400	185,000	200,000
භාණ්ඩාගාර ප්‍රතිපාදන ප්‍රාග්ධන - (මෙහෙයුම්)	12,345	16,927	18,700
වෙනත් ආදායම්	17,950	11,171	18,870
මුළු ආදායම	**346,662**	**401,654**	**370,520**
පරිපාලන වියදම්	(204,943)	(211,971)	(212,610)

සැපයුම් සහ අවශ්‍යතා	(38,467)	(42,652)	(45,800)
කොන්ත්‍රාත් ගත සේවා හා නඩත්තු	(21,796)	(26,998)	(25,960)
වෙනත් මෙහෙයුම් වියදම්	(12,071)	(18,061)	(12,695)
වෙනත් ව්‍යාපෘති වියදම්	(6,335)	(41,586)	(9,055)
භාණ්ඩාගාර ප්‍රතිපාදන (පර්යේෂණ අධ්‍යයනයන්- ප්‍රාග්ධන)	(12,345)	(16,927)	(18,700)
ක්ෂයවීම්	(9,504)	(9,801)	(15,000)
මුළු වියදම	(305,461)	(367,996)	(339,820)
මෙහෙයුම් වලින් අතිරික්තය/ඌණතාවය	41,201	33,658	30,700
බදු	(1,611)	(96)	-
කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය/ඌණතාවය	39,590	33,562	30,700

ජල සම්පත් මණ්ඩලය

මූල්‍ය තත්ව ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනට	සටහන් අංක	සත්‍ය - 2018 රු.000'	අයවැයගත - 2019 රු.000'
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් හා මුදල් සමාන දෑ	05	99,794	53,572
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ	06	40,256	108,601
තොග	07	142,896	159,053
කලින් ගෙවීම්	08	414	830
		283,360	322,056
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	09	574,838	318,909
මුළු වත්කම්		858,198	640,965
වගකීම්			
ජංගම වගකීම්			
වෙනත් වෙන්කිරීම් හා ගෙවිය යුතුදෑ	11	9,701	15,238
විලම්භිත ආදායම් (සේවා අත්තිකාරම්)	12	15,919	36,330
ජංගම නොවන වගකීම්		25,620	51,568
විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම්	13	73,281	68,219
විලම්බිත ආදායම් (රජයේ ප්‍රදාන සඳහා)	14	537,601	277,654
මුළු වගකීම්		610,882	345,873
ශුද්ධ වත්කම්		636,502	397,441

ශුද්ධ වත්කම්/ස්කන්ධය		221,696	243,524
සමුච්චිත අරමුදල	15	256,618	256,618
වෙනත් ප්‍රධාන	15	235,227	294,206
සමුච්චිත ලාභ/ (අලාභ)	15	274,549	(311,700)
ප්‍රත්‍යාගණන සංචිතය	15	4,400	4,400
මුළු ශුද්ධ වත්කම් / ස්කන්ධය		221,696	221,696

මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි සමස්ත පරිපූරණය සඳහා අවශ්‍ය වන ගිණුම්කරණ ප්‍රමිතීන් හා සටහන් පිටු අංක 06 සිට 21 තෙක් ඇතුලත් වේ.

මණ්ඩලයේ පවත්නා වාර්තාවලට අනුව ඉහත සඳහන් මූල්‍ය ප්‍රකාශන සත්‍ය හා නිවැරදි බවට මා විසින් සහතික කරමි.

අත්සන් කළේ - ඒ.බී.එම්. චන්ද්‍රසිරි
සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්)

අත්සන් කලේ - ජී.ආර්.ආර් කරුණාරත්න
සාමාන්‍යාධිකාරී

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වගකීම පැවරේ. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් කලෙමි.

අත්සන් කළේ- ආචාර්ය ජේ.ඩී. සමරසිංහ
සභාපති

අත්සන් කලේ - රත්නමලල බණ්ඩාර
අධ්‍යක්ෂ

ජල සම්පත් මණ්ඩලය
2020 පෙබරවාරි 19

ශුද්ධ වත්කම් / ස්කන්ධය වෙනස්වීමේ ප්‍රතිශතය

දෙසැම්බර් 31 දිනට
සටහන් : 15

	සමුච්චිත අරමුදල	වෙනත් ප්‍රධාන	ප්‍රත්‍යාගණන සංචිත	සමුච්චිත ලාභ/අලාභ	එකතුව
	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000
2017 දෙසැම්බර් 31 දිනට ඉ/ගෙ ශේෂය	**256,618**	**233,273**	**1,172**	**(349,523)**	**141,540**
පෙර කාලපරිච්ඡේද වල සිදුවීම් සඳහා කරන ලද ගැලපීම්	-	-	-	4,261	4,261
නැවත ප්‍රකාශිත ශේෂය	256,618	233,273	1,172	(345,262)	145,801
කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/ (ඌනතාවය)	-	-	-	33,562	33,562
ප්‍රත්‍යාගණන ගැලපීම	-	-	3,228	-	3,228
යන්ත්‍ර මිලදී ගැනීම සඳහා අමාත්‍යාංශ අත්තිකාරම් නිදහස් කිරීම	-	60,933	-	-	60,933
2018 දෙසැම්බර් 31 දිනට ශේෂය	**256,618**	**294,206**	**4,400**	**(311,700)**	**243,524**
2018 දෙසැම්බර් 31 දිනට ඉදිරියට ගෙනා ශේෂය	**256,618**	**294,206**	**4,400**	**(311,700)**	**243,524**
පෙර කාල පරිච්ඡේද වල සිදුවීම් සඳහා කරන ලද ගැලපීම්	-	-	-	(1,641)	(1,641)
නැවත ප්‍රකාශිත ශේෂය	256,618	294,206	4,400	(313,341)	241,883
කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/ (ඌනතාවය)	-	-	-	39,590	39,590
ගොඩනැගිලි වැඩිදියුනු කිරීම සඳහා කෙරීගෙන යන වැඩ	-	1,954	-	-	1,954
යන්ත්‍ර මිලදී ගැනීම සඳහා අමාත්‍යාංශ අත්තිකාරම් නිදහස් කිරීම	-	(60,933)	-	-	(60,933)
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් මත වූ ලාභය/ (අලාභය)	-	-	-	(798)	(798)
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	**256,618**	**235,227**	**4,400**	**(274,549)**	**221,696**

සටහන්:- වෙනත් ප්‍රදාන පිළිබඳ විස්තර

වෙනත් ප්‍රධාන	**31.12.2019 දිනට ශේෂය (රු.000)**
ජයිකා	11,973
ජාතික ජල සම්පත් අධිකාරිය සහ ඒ ඩී බී	1,025
වෙනත්	24,624
ජපන් 2 කේ. ආර්. ව්‍යාපෘතිය	81,476
ඇමරේසියන් සමාගමේ අරමුදල	1,771
DSWRPP අරමුදල	112,404
පුනරුත්ථාපන හා වැඩි දියුණු කිරීම්	1,954
එකතුව	**235,227**

ජල සම්පත් මණ්ඩලය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2019		2018	
	රු.000		රු.000	
මෙහෙයුම් කටයුතු වලින් වූ මුදල් ප්‍රවාහය				
භාණ්ඩාගාර ප්‍රතිපාදන (පුනරාවර්ථන) වලට පෙර වර්ෂයේ ලාභය/ අලාභය		(139,199)		(151,342)
එකතුකලා: භාණ්ඩාගාර ප්‍රතිපාදන - (පුනරාවර්ථන) ලැබීම්		180,400		185,000
වර්ෂය සඳහා බදු පෙර ලාභය / (අලාභය)		**41,201**		**33,658**
අඩුකලා: පෙර වසරේ ගැලපීම්		(148)		(54)
		41,053		**33,604**
මුල්‍ය නොවන සංචලනයන්				
ක්ෂයවීම්	9,504		9,801	
පාරිතෝෂිත වෙන් කිරීම් වැඩි කිරීම	12,759		14,809	
ගෙවිය යුතු දෑ වැඩිවීම	(26,904)		(43,724)	
වෙනත් ජංගම වත්කම් අඩුවීම	15,080		12,397	
ස්ථාවර වත්කම් විකිණීමෙන් ලත් ලාභය/(පාඩුව)	(89)		(2,227)	
ලැබිය යුතු දෑ වැඩිවීම	5,842	16,192	(10,606)	(19,550)
		57,245		**14,054**
පාරිතෝෂිත හා බැංකු ඉතිරිකිරීම් වලින් ලද පොළී ලැබීම්	(3,685)		(300)	
බදු ගෙවීම	(41)	(3,726)	(46)	(346)
මෙහෙයුම් කටයුතු වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		**53,519**		**13,708**
ආයෝජන කටයුතුවලින් වූ මුදල් ප්‍රවාහය				
දේපල, පිරියත හා උපකරණ විකිණීමෙන් ලත් මුදල	92		2,861	
දේපල, පිරියත හා උපකරණ මිලදී ගැනීම	(285,672)		(24,109)	
පාරිතෝෂිත ඉතිරි කිරීම් වලින් ලද පොළී	3,686		300	
පාරිතෝෂිත ගෙවීම්	(7,539)		(13,157)	
ආයෝජන කටයුතු වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		**(289,433)**		**(34,105)**
මූල්‍යන කටයුතු වලින් වූ මුදල් ප්‍රවාහය				
රජයේ ප්‍රධාන (දේපල, පිරියත හා උපකරණ සඳහා ප්‍රාග්ධනය)	8,757		1,903	
අමාත්‍යාංශ ප්‍රතිපාදන (දේපල, පිරියත හා උපකරණ සඳහා ප්‍රාග්ධනය)	273,379		81,152	
යන්ත්‍ර මිලදී ගැනීම සඳහා අත්තිකාරම් ගෙවීම්	-		(60,933)	

මූල්‍යන කටයුතු වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**282,136**	**22,122**
මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/ (අඩුවීම)	**46,222**	**1,725**
වර්ෂයේ මුල මුදල් හා මුදල් සමාන දෑ	**53,572**	**51,847**
වර්ෂයේ අග මුදල් හා මුදල් සමාන දෑ	**99,794**	**53,572**

- **මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය සඳහා සටහන්**

01 මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වන්නේ අතැති මුදල් හා බැංකුවල පවත්නා ශේෂයන්ගෙනි. මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි අඩංගු වන මුදල් හා මුදල් සමාන දෑ සඳහා ඇතුලත්ව ඇති මූල්‍ය තත්ව ප්‍රමාණ පහත දැක්වේ.

	2019	2018
	Rs'000	**Rs'000**
බැංකු වල ඇති ජංගම ගිණුම් ශේෂයන්	**70,474**	**39,956**
ජාතික ඉතිරි කිරීමේ බැංකු ඉතිරි කිරීම්	**29,320**	**13,616**
	99,794	**53,572**

02
මෙහෙයුම් කටයුතු සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන (ප්‍රාග්ධන) වලින් වූ මුදල් ප්‍රවාහය අන්තර් ගත වී ඇත්තේ මෙහෙයුම් කටයුතු වලින් වූ මුදල් ප්‍රවාහය තුලය.

ජල සම්පත් මණ්ඩලය 04

භාණ්ඩාගාර ප්‍රතිපාදන නිදහස් කිරීම් සැසඳුම - 2019 වසර

හෙලිදරව් කිරීමේ ප්‍රකාශය	මුදා හැරීම් (රු.000')	භාණ්ඩාගාර මුදණ පිටපතට අනුව (රු.000')	වෂර්ය සඳහා වෙන් කිරීම් (රු.000')
01. පුනරාවර්ථන වැය ප්‍රතිපාදන			
වැයශීර්ෂ අංක : 118 - 01 - 07 - 02 - 1503			
- මූල්‍ය කාර්යය සාධනය	180,400	180,400	200,000
	-	-	-
	180,400	**180,400**	**200,000**
02 ප්‍රාග්ධන වැය ප්‍රතිපාදන			
වැයශීර්ෂ අංක : 118 - 01 - 07 - 02 - 2201			
මූල්‍ය කාර්යය සාධනය - මෙහෙයුම්	12,345	-	-
මූල්‍ය තත්වය වෙනස් වීමේ ප්‍රකාශනය (වත්කම් මිලදි ගැනීම් සඳහා)	8,757	-	-
	21,102	21,102	32,000

මූල්‍ය ප්‍රකාශන හා ගිණුම්කරණ ප්‍රතිපත්තීන්ට අදාල සටහන්

01) සංස්ථාපිත තොරතුරු

♦ සාමාන්‍ය

ජල සම්පත් මණ්ඩලය 1964 අංක 29 දරණ පනතේ විධිවිධාන යටතේ 1966 දී පිහිටුවන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයකි.

♦ ප්‍රධාන ක්‍රියාකාරකම් හා එහි ස්වභාවය

මෙම වර්ෂයේදී මණ්ඩලයේ මූලික ක්‍රියාකාරකම් වලට භූ ජල සමීක්ෂණ සිදු කිරීම, නළ ලිං ඉදිකිරීම, ජල නියැදි වල රසායනික විශ්ලේෂණය, වළ ලිං පිරිසිදු කිරීම සහ භූගත ජල සිතියම් සැකසීම හා 2017.03.16 දිනැති ගැසට් නිවේදන අංක 2010/23 පරිදි ස්වභාවික ජල මූලාශ්‍ර හා භූගත ජලය සම්බන්ධව සිදුකල යුතු සුපරීක්ෂණය හා අධීක්ෂන කටයුතු ඇත්ලත් විය.

♦ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් ප්‍රකාශය

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳේ.

♦ මණ්ඩලයේ ප්‍රධාන ක්‍රියාකාරකම් ඉටුකරනු ලබන ප්‍රධාන කාර්යාලයේ ලිපිනය.

අංක 2ඒ, හෙක්ටර් කොබ්බෑකඩුව මාවත, කොළඹ - 07.

02) වැදගත්වන ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.1 අනුකූලතාවය පිළිබඳ ප්‍රකාශය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත කමිටුව හා මුදල් අමාත්‍යාංශයේද එකගතාවය මත නිකුත් කරන ලද රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ජල සම්පත් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත. (යොමුව - 2013.10.02 දිනැති අංක ඡෑ/03/2013 දරණ චක්‍රලේඛය)

රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 04,05,13,16,17,18 හා 20 යන ගිණුම්කරණ ප්‍රමිත වර්තමානයෙදී මණ්ඩලයට අදාල නොවේ.

2.2 සකස් කිරීමේ පදනම

ඓතිහාසික පිරිවැය පදනම මත මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

2.3 ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර එය මණ්ඩලයේ කටයුතු කරන මුදල් වර්ගය වන අතර සියලු මූල්‍ය තොරතුරු විශේෂයෙන් සඳහන් කර නොමැති නම් හැරෙන්නට ආසන්න දහස් ගණනට ඉදිරිපත් කර ඇත.

03) වත්කම් හා ඒවා ඇගයීමේ පදනම

3.1 දේපල, පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ මුල් වරට පිරිවැයට ගණන් ගෙන ඇති අතර සමුච්චිත ක්ෂය අඩුකල අගය වාර්තා කර ඇත. දේපල, පිරියත හා උපකරණවල පිරිවැය යනු මිලදී ගැනීම් / ප්‍රත්‍යාගණන අගය හෝ ඉදිකිරීම සඳහා වැය වන වියදම හා බැඳුණු මුලික වියදම් ද සමඟ වේ.

ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම් ප්‍රත්‍යාගණන අගය අනුව ඉදිරියට ගෙනයනු ලබන අතර පසුකාලීන ක්ෂයවීම් අඩුකරනු ලැබේ.

3.2 ක්ෂය වීම්

වත්කම් භාවිතයට ගැනීම සුදානම් වන අවස්ථාවේදී ක්ෂය කරනු ලබන අතර භාවිතයෙන් ඉවත් කරන වත්කම් එසේ හඳුනාගන්නා දිනයේදී ක්ෂයවීම් නතර කරනු ලැබේ.

දේපල, පිරියත හා උපකරණ වල කෂයවීම්ගණනය කරනු ලබන්නේ ඒවායේ පිරිවැය / ප්‍රත්‍ය ගණන අගය ඵලදායී ජීවිත කාලය සැලකිල්ලට ගෙන සරල මාර්ග ක්‍රමයටයි. මෙම අරමුණ ඇතිව යොදා ගනු ලබන ප්‍රධාන වාර්ෂික ක්ෂය අනුපාත මෙසේය.

ගොඩනැගිලි	-	5%
මොටර් වාහන	-	25%
යන්ත්‍රෝපකරණ	-	20%
රසායනාගාර උපකරණ	-	20%
විද්‍යාත්මක උපකරණ	-	20%
පරිගණක සහ උපාංග	-	20%
ගෘහභාණ්ඩ සවිකිරීම හා කාර්යාල උපකරණ	-	10%

3.3 රජයේ ප්‍රදාන

භාණ්ඩාගාරයෙන්, රේඛීය අමාත්‍යාංශයෙන් සහ වෙනත් අදාල රාජ්‍ය ව්‍යාපෘති වලින් ලබා ගන්නා ලද වත්කම් විලම්බිත ආදායම් ප්‍රවේශය යටතේ හඳුනාගනු ලැබේ. වත්කම් වල ජීවිත කාලය අනුව ක්‍රමානුකූල පදනමක් මත මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය තුල ක්ෂය කිරීමේ ගිණුමට හිලව් වන පරිදි විලම්බිත ආදායම (රජයේ ප්‍රදාන වලට සම්බන්ධ) කපා හැරේ.

3.4 ඉතිරි තොග

වාහන අමතර කොටස්, ගබඩා ද්‍රව්‍ය, යන්ත්‍රෝපකරණ අමතර කොටස්, ඉන්ධන හා අනෙකුත් පාරිභෝජන ද්‍රව්‍ය යනාදියෙන් ඉතිරි තොග සමන්විත වේ. තොග පිරිවැය සමන්විත වන්නේ පළමුව ලබාගත් තොග පළමුව නිකුත් කිරීමේ (FIFO) පදනම මතය.

3.5 ලැබිය යුතු දෑ

3.5.1 උපලබ්ධි විය හැකි බවට ඇස්තමේන්තු ගත කරන ලද ප්‍රමාණයන්ගෙන් ලැබිය යුතු දෑ ප්‍රකාශ වේ.

3.5.2 බොල්ණය හා අඩමාණ ණය

මෙම ණය සඳහා ඇස්තමේන්තු කල අලාභ පදනම් වී ඇත්තේ සියලු ඉන්වොයිසිවල සහ ගෙවීම් පිළිබඳ සිදුකල අඛන්ඩ ඇගයීම් ක්‍රමය පදනම් කර ගෙනය.

4.1 ගෙවිය යුතු දෑ සහ උපචිත වියදම්

වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ පිරිවැයට ඉදිරිපත් කෙරේ.

විලම්බිත ආදායම

සේවා ලබා ගැනීම සඳහා ලද අත්තිකාරම්, ආදායම් ලෙස හඳුනා ගන්නාතෙක් මූල්‍ය තත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් යටතේ කලින් ලද ආදායම් ලෙස දැක්වේ.

4.2 වෙන්කිරීම්

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස වර්ථමානයේ පවත්නා බැඳීම් (නෛතික හෝ සම්මුතික) වෙනුවෙන් විශ්වාසදායී ලෙස ඇස්තමේන්තු කල හැකි වීම මත ප්‍රතිපාදන හඳුනාගනු ලැබේ. වියදම් සම්බන්ධයෙන් කරන ලද ප්‍රතිපාදනයන් ප්‍රතිපූර්ණය කිරීම මුල්‍ය කාර්ය සාධනයෙන් ඉදිරිපත් කෙරේ.

05) ආදායම් හඳුනා ගැනීම

ආදායම් හඳුනාගනු ලබන්නේ ආර්ථික ප්‍රතිලාභ ජල සම්පත් මණ්ඩලයට ගලා එනු ලැබීමේ හැකියාව ඇති වීම සහ ඒවා විශ්වාසනීය ලෙස මැනිය හැකි විට මිස ගෙවීම් සිදුකල විට නොවේ.

ප්‍රධාන ආදායම් මාර්ග

භූ විද්‍යාත්මක සමීක්ෂණ, නල ළිං ඉදි කිරීම, අත් පොම්ප සවිකිරීම, පොම්ප පරීක්ෂණ, නල ළිං පිරිසිදු කිරීම, ජල සාම්පල විශ්ලේෂණය සහ ජලයේ අඩංගු යකඩ නිස්සාරණ පෙරණ සවිකිරීම ආදියෙන් වන අතර අදාල කාර්යයන් ඉටුකිරීමෙන් පසු ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

වෙනත් ආදායම්

සංචාරක බංගලා වෙන්කිරීම්, දඩ, අධිභාර, යෝග්‍යතා සහතික ආදායම් හා විවිධ ආදායම් වලින් වෙනත් ආදායම් සමන්විත වන අතර ඒවා උපචිත පදනම මත හඳුනාගනු ලැබේ.

පොළී ආදායම්

පොළී ආදායම මූලික වශයෙන් ආපදා ණය, පාපැදි ණය සහ පාරිතෝෂිත ගෙවීම් සඳහා ඉතිරි කිරීමේ බැංකුවේ තැන්පතු සඳහා පොළිය යනාදියෙන් සමන්විත වේ.

06) විශ්‍රාමික පාරිතෝෂිත බැඳීම

6.1 පාරිතෝෂිත ප්‍රතිලාභ සැලැස්ම

1983 අංක 12 දරණ පාරිතෝෂිත මුදල් ගෙවීම සඳහා ගෙවිය යුතු විශ්‍රාම පාරිතොෂිතය සඳහා මූල්‍ය ප්‍රකාශනයේ ප්‍රතිපාදන වෙන්කර ඇත. මූල්‍ය ප්‍රකාශණ වාර්තාකරන දිනට සේවකයින් වෙනුවෙන් හඳුනාගත් ප්‍රතිලාභ බැඳීම් වර්තමාන අගය මත පදනම්ව ගණනය කර ඇත. මෙම සේවක ප්‍රතිලාභ බැඳීම් ගණනය කිරීම සුදුසුකම් ලත් තක්සේරුකාර ආයතනයක් වන Actuarial Management Consultants පුද්ගලික සමාගම

විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත 19 හා අනුකූල වන පරිදි සෑම වර්ෂයක් සඳහාම 2018.01.01 දින සිට තක්සේරු කරනු ලැබේ. එමෙන්ම සේවකයන්ගේ සේවයට බැඳුනු දිනය මෙහිලා සැලකිල්ලට ගනු ලැබේ.

වත්කම් සැලැස්ම

මෙම සේවක ප්‍රතිලාභ බැඳීම් සඳහා අරමුදල් සපයා ගැනීම වෙනුවෙන් ජල සම්පත් මණ්ඩලය මගින් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ වෙනම ඉතිරි කිරීමේ ගිණුමක් පවත්වාගෙන යනු ලැබේ.

6.2 සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල් දායක සැලැස්ම

සේ.අ. අරමුදල් හා සේ.නි.හා අරමුදලේ දායක මුදල් අදාල ප්‍රඥප්ති සහ රෙගුලාසි වලට අනුකූල වන සේවකයන් සුදුසුකම් ලබයි. සේ.අ. අරමුදල් හා සේ.නී.හා අරමුදල් සඳහා මණ්ඩලයේ දායකත්වය පිළිවෙලින් 12% ක සහ 3% ක් වේ.

07) බඳුකරණය

බදු වියදම, ප්‍රවර්තන සහ පෙර වර්ෂ සඳහා වන ගැලපීම් වෙනුවෙන් ගෙවිය යුතු බදු මුදල් වලින් සමන්විත වේ.

08) පර්යේෂණ අධ්‍යයන වියදම්

භාණ්ඩාගාර ප්‍රතිපාදන ප්‍රාග්ධන වැය ශීර්ෂ යටතේ පර්යේෂණ අධ්‍යයන සඳහා සෘජුව හඳුනාගෙන ඇති මෙහෙයුම් පිරිවැය මුල්‍ය කාර්ය සාධන ප්‍රකාශයෙන් ඉදිරිපත් කෙරේ.

09) මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 2 ට අනුව වක්‍ර ක්‍රමය උපයෝගී කරගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකසා ඇත. මෙහෙයුම් කටයුතුවලින්, ආයෝජන කටයුතු වලින් හා මූල්‍යන කටයුතු වලින් ලද දළ මුදල් ගලා ඒම් සහ භාවිතයන් එහි හඳුනාගෙන ඇති අතර මුදල් හා මුදල් සමාන දෑ ප්‍රධාන වශයෙන් බැංකුවේ පවතින ශේෂයන්ගෙන් සමන්විත වේ.

10) වාර්තා කරන දිනෙන් පසු සිදුවීම්

වාර්තා කරන දිනෙන් පසු හඳුනාගනු ලබන සියලුම ප්‍රමාණාත්මක සිදුවීම් අදාල පරිදි මූල්‍ය ප්‍රකාශන වල ගැලපීම් කිරීමත් අනාවරණය කිරීමත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්

මෙහෙයුම් කටයුතු වලින් ලද ආදායම	සත්‍ය	සත්‍ය	අයවැයගත
	2019	**2018**	**2019**
සටහන් අංක : 01	**රු.000'**	**රු.000'**	**රු.000'**
භූ ජල සමීක්ෂණ /භූගත ජල ගවේෂණය			
භූ ජල සමීක්ෂණ	26,051	34,473	20,000
නල ළිං ඉදිකිරීම	60,481	71,653	63,000
අත් පොම්ප සවිකිරීම	2,563	8,155	2,400
ජල ධාරිතා පරීක්ෂණ	34,651	34,709	35,000
නල ළිං පිරිසිදු කිරීම	1,286	1,138	750
ජල නියැදි විශ්ලේෂණය	2,724	2,521	2,400
ජල පෙරන සවිකිරීම	-	102	-
ජල මාපක ආදායම	548	533	400
උප එකතුව	**128,304**	**153,284**	**123,950**

භූගත ජල සංවර්ධනය

වෙලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතිය	-	1,508	-
නියඟයෙන් පීඩාවට පත් ප්‍රදේශ සඳහා නල ළිං ඉදිකිරීම	-	1,407	-
යාපනය අර්ධද්වීපයේ භූජල අධ්‍යයනය	5,127	908	7,000
විදුම් යන්ත්‍ර 03 සඳහා මඩ පොම්ප සවිකිරීම	-	29,912	-
භූ ජල නියාමන ව්‍යාපෘතිය - මල්වතු ඔය	482	989	1,000
භූ ජල නියාමන ව්‍යාපෘතිය - යාන් ඔය	554	505	1,000
ලෝක ජල දිනය		43	-
UNDP වැඩසටහන	1,500	-	-
උප එකතුව	**7,663**	**35,272**	**9,000**
මුළු එකතුව	**135,967**	**188,556**	**132,950**

මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්

මෙහෙයුම් කටයුතු වලින් ලද ආදායම	සත්‍ය	සත්‍ය	අයවැයගත
	2019	**2018**	**2019**
සටහන් අංක : 02	**රු.000'**	**රු.000'**	**රු.000'**
භාණ්ඩාගාර ප්‍රතිපාදන - ප්‍රාග්ධන			
(පර්යේෂණ අධ්‍යනයන් - මෙහෙයුම්)			
කාලගුණ විපර්යාසයේ සෘජු හා වක්‍ර බලපෑම පිළිබඳව අධ්‍යයනය	1,109	1,270	1,400
වකුගඩු රෝගය සම්බන්ධව ජලයේ ගුණත්ව අධ්‍යයන ව්‍යාපෘතිය	680	4,900	1,900
හම්බන්තොට, බදුල්ල,මොණරාගල ප්‍රදේශයන්හි අත්පොම්ප නල ළිං පුනරුත්ථාපනය	1,053	2,000	1,200
කාර්යය මණ්ඩල පුහුණුව	929	476	1,000
පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම් සඳහා මුදා හැරීම්	2,228	3,241	1,200
හදිසි භූ ජල සංවර්ධනය	3,942	2,790	4,000
සංවේදී භූ විෂමතා පිළිබඳ වූ භූ ජල අධීක්ෂණය	1,129	1,750	2,000
භූ ජල සම්පත් හායනය හා දූෂණය පිළිබඳ පරීක්ෂාව	306	413	500
අධ්‍යන වාර්තා ප්‍රසිද්ධ කිරීම	12	87	2,000
රසායනාගාර වැඩිදියුනු කිරීම හා නඩත්තුව	107	-	2,400
තාක්ෂණික කටයුතු	850	-	1,100
මුළු එකතුව	12,345	16,927	**18,700**

සටහන් අංක : 03

වෙනත් ආදායම්

සංචාරක නිවාස ආදායම	139	55	80
දඩ මුදල් හා අධිභාර	1,139	4	1,100
විවිධ ආදායම්	2,268	1,082	1,500
වත්කම් අපහරණය කිරීමේ ආදායම	89	-	4,000
ණය හා බැංකු තැන්පතු මත පොළී ආදායම	3,685	1,473	2,000
සේවක නේවාසික කුළී ආදායම	140	114	90
යෝග්‍යතා සහතික ආදායම	10,407	8,265	10,000
ලියාපදිංචි ගාස්තු ආදායම	83	178	100
මුළු එකතුව	**17,950**	**11,171**	**18,870**

මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්

	සත්‍ය 2019 රු.000'	සත්‍ය 2018 රු.000'	අයවැයගත 2019 රු.000'
සටහන් අංක : 4.1 පරිපාලන වියදම්			
වැටුප් හා වේතන	150,190	153,492	158,000
අතිකාල හා නිවාඩු දින වැටුප්	13,968	13,425	13,000
සේවක අර්ථ සාධක අරමුදලට ගෙවී (- 12% +3%)	20,131	19,534	18,200
සේවක ප්‍රතිලාභ සැලැස්මෙහි පිරිවැය (පාරිතෝෂිත)	12,759	14,809	14,000
අධ්‍යක්ෂකවරුන්ගේ ගාස්තු	309	389	400
වෙනත් දීමනා	155	115	60
ගමන් වියදම් - දේශීය	5,782	7,293	7,000
ගමන් වියදම් (දීමනා) - විදේශීය	62	1,649	200
සුභසාධක වියදම් හා ක්‍රීඩා පහසුකම්	144	172	500
වෛද්‍යාධාර ගෙවීම්	768	721	800
සංග්‍රහ කිරීම්	463	187	250
විවේක නිවාඩු සඳහා ගෙවීම්	212	185	200
මුළු එකතුව	**204,943**	**211,971**	**212,610**
සටහන් අංක : 4.2 සැපයුම් හා පාරිභෝජන ද්‍රව්‍ය			
ඉන්ධන හා ලිහිසි තෙල්	22,229	26,651	250,00
විදුම් පාරිභෝජන ද්‍රව්‍ය	13,686	12,464	17,000
රසායනාගාර පාරිභෝජන ද්‍රව්‍ය හා වෙනත්	2,161	2,637	3,000
වෙනත් පාරිභෝජන ද්‍රව්‍ය	391	900	800
මුළු එකතුව	**38,467**	**42,652**	**45,800**
සටහන් අංක : 4.3 ගිවිසුම්ගත සේවාවන් හා නඩත්තු වියදම්			
තැපැල් හා දුරකථන	1,985	1,943	1,900
විදුලිය	2,993	2,346	2,800
ගෙවල් කුලී,	360	-	750
වරිපනම් හා බදු	593	1,636	300
මාර්ගස්ථ මුදල් රක්ෂණය	12	3	10
විගණන ගාස්තු	400	400	400
මුද්‍රණ	452	347	400
වැඩමුළු හා සම්මන්ත්‍රණ	205	691	500
ජල බිල්පත්	304	170	200
නවාතැන් පහසුකම්	881	-	700
උපදේශක ගාස්තු	385	292	300
විවිධ වියදම්	768	484	700
මෝටර් වාහන නඩත්තු වියදම්	4,849	4,552	6,000
යන්ත්‍රෝපකරණ නඩත්තු වියදම්	3,904	9,369	6,000
කාර්යාල උපකරණ නඩත්තු වියදම්	3,032	2,513	3,000
ගොඩනැගිලි නඩත්තුව වියදම්	673	2,252	2,000
මුළු එකතුව	**21,796**	**26,998**	**25,960**

මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්	සත්‍ය 2019 රු.000'	සත්‍ය 2018 රු.000'	අයවැයගත 2019 රු.000'
සටහන් අංක : 4.4 වෙනත් මෙහෙයුම් වියදම්			
ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා	939	696	1,000
නිල ඇඳුම්	466	482	500
වාර ප්‍රකාශන හා පුවත්පත්	90	130	150
ප්‍රචාරණය	1,510	704	1,000
බැංකු ගාස්තු	146	156	190
වෛද්‍ය පරීක්ෂණ ගාස්තු	-	82	80
නීති වියදම්	-	-	500
මුද්දර බදු	83	21	125
වාහන සේවා කිරීම - රත්මලාන	931	500	800
කුලී ගාස්තු	459	13	100
දඩ හා අධිභාර	4	44	50
බොල් ණය	-	769	-
මෙහෙයුම් කල්බදු වාරික	4512	6,370	4,900
ජාතිය ගොඩනැගීමේ බදු වියදම	2931	3,329	3,300
වත්කම් අපහරන අලාභය	-	4,765	-
මුළු එකතුව	**12,071**	**18,061**	**12,695**

සටහන් අංක : 4.5 වෙනත් ව්‍යාපෘති වියදම්			
නියගයෙන් පීඩාවට පත් ප්‍රදේශ වල නල ළිං ඉදි කිරීම	-	1,407	-
යාපනය අර්ධද් දීපයේ භූ ජල අධ්‍යනය	5,127	2,867	7,000
විදුම් යන්ත්‍ර 03ක් සඳහා මඩ පොම්ප සවි කිරීම	-	29,912	-
භූ ජල නියාමන ව්‍යාපෘතිය - මල්වතු ඔය	482	2,032	1,000
භූ ජල නියාමන ව්‍යාපෘතිය - යාන් ඔය	671	2,016	1,000
ජල දින වියදම්	55	838	55
වේලි ආරක්ෂන ව්‍යාපෘතිය	-	2,514	-
මුළු එකතුව	**6,335**	**41,586**	**9,055**

මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්	සත්‍ය 2019 රු.000'	සත්‍ය 2018 රු.000'	අයවැයගත 2019 රු.000'
සටහන් අංක : 4.6 භාණ්ඩාගාර ප්‍රතිපාදන - ප්‍රාග්ධන			
(පර්යේෂණ අධ්‍යනයන් - මෙහෙයුම්)			
කාලගුණ විපර්යාසයේ සෘජු හා වක්‍ර බලපෑම අධ්‍යනය	1,109	1,270	1,400
වකුගඩු රොගය සම්බන්දව ජලයේ ගුණත්වය අධ්‍යන ව්‍යාපෘතිය	680	4,900	1,900
හම්බන්තොට බදුල්ල හා මොණරාගල අත් පොම්ප ලිං පුනරුත්තාපනය	1,053	2,000	1,200
කාර්යය මණ්ඩල පුහුනුව	929	476	1,000
පුනරුත්තාපනය හා වැඩි දියුණු කිරීම් සඳහා මුදාහැරීම්	2,228	3,241	1,200
හදිසි භූ ජල සංවර්ධනය	3,942	2,790	4,000
සංවේදී භූ විෂමතා පිළිබඳ භූ ජල අධීක්ෂණය	1,129	1,750	2,000
භූ ජල සම්පත් දූෂණය පිළිබඳ පරීක්ෂාව	306	413	500
අධ්‍යන වාර්තා ප්‍රසිද්ධ කිරීම	12	87	2,000
රසායනාගාර වැඩි දියුණු කිරීම හා නඩත්තුව	107	-	2,400
තාක්ෂණික කටයුතු	850	-	1,100
මුළු එකතුව	**12,345**	**16,927**	**18,700**

සටහන් අංක : 05

මුදල් හා මුදල් සමාන දෑ		
(1) ලංකා බැංකුව යෝක් වීදිය ශාඛාව (0002026295)	586	2,130
(2) ලංකා බැංකුව ටොරින්ටන් චතුරශ්‍ර ශාඛාව (0002323267)	69,720	36,536
(3) ලංකා බැංකුව ටොරින්ටන් චතුරශ්‍ර ශාඛාව (0002323268)	11	11
(4) ලංකා බැංකුව ටොරින්ටන් චතුරශ්‍ර ශාඛාව (0005342839)	157	1,279
උප එකතුව	**70,474**	**39,956**
සේවක ප්‍රතිලාභ - වත්කම් සැලැස්ම		
(5) ජාතික ඉතිරි කිරීමේ බැංකුව බම්බලපිටිය ශාඛාව (100230211818)	29,320	13,616
මුළු එකතුව	**99,794**	**53,572**

සටහන - අරමුදල් කළමණාකරන ගිණුම

ලංකා බැංකුව ටොරින්ටන් චතුරශ්‍ර ශාඛාවේ දැනට පවතින අංක 0002323267 දරණ ජංගම ගිණුම හා ඒකාබද්ධව අංක 83141035 දරණ අරමුදල් කලමනාකරණ ගිනුමක් ජංගම ගිණුමේ පවතින මුදල් ශේෂය සඳහා පොලියක් ඉපයීමේ අරමුනින් වර්ෂ 2018.09.07 දින ආරම්භ කරන ලදි. (අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක - 1203 මත)

මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්

සටහන් අංක : 06	**2019**	**2018**
වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ	**රු.000'**	**රු.000'**
සේවක		
(01) ආපදා ණය	19,895	14,382
(02) උත්සව අත්තිකාරම්	30	30
(03) විශේෂ ණය	125	312
(04) සේවක ණයගැතියෝ	-	2
උප එකතුව	20,050	**14,726**
වෙනත්		
(05) වෙළඳ	20,503	26,856
(06) සැපයුම් අත්තිකාරම්	-	60,933
(07) ලැබිය යුතු රදවා ගැනීම්	151	1,160
(08) ලැබිය යුතු ආර්ථික සේවා ගාස්තු	534	1,344
(09) ලැබිය යුතු එකතු කල අගය මත බදු (ආපසු ගෙවීම්)	1,263	1,263
(10) වෙනත් ලැබිය යුතු දෑ	245	5,855
(11) තොග ඌනතා	118	118
උප එකතුව	22,814	**97,529**
ලැබිය යුතු දෑ මුළු එකතුව	**42,864**	112,**255**
(12) අඩු කළා : ගෙවිය යුතු එකතු කල අගය මත බදු	(2,608)	(3,654)
මුළු එකතුව	**40,256**	**108,601**

සටහන් අංක : 07

තොග

ද්‍රව්‍ය හා අමතර කොටස්		
වාහන අමතර කොටස්	2,668	1,699
වාහන අමතර කොටස් (වේලි ආරක්ෂණ ව්‍යාපෘතිය)	2,056	2,101
ඉන්ධන හා ලිහිසි තෙල්	1,618	1,918
විදුම් පාරිභෝජන ද්‍රව්‍ය	29,812	45,606
ගොඩනැගිලි ද්‍රව්‍ය	1,286	707
ලිපිද්‍රව්‍ය	348	371
යන්ත්‍රෝපකරණ අමතර කොටස් (2 කේ. ආර් අමතර කොටස්)	60,050	58,466
යන්ත්‍රෝපකරණ අමතර කොටස් (වේලි ආරක්ෂණ ව්‍යාපෘතිය)	39,495	41,854
යන්ත්‍රෝපකරණ අමතර කොටස් (අමාත්‍යාංශ)	2,820	3,051
රසායනාගාර පාරිභෝජන ද්‍රව්‍ය	2,743	3,280
එකතුව	**142,896**	**159,053**

සටහන් අංක : 08

ඉදිරියට කල ගෙවීම්		
මෝටර් වාහන නඩත්තු	-	10
මුද්දර ගාස්තු	151	215
මාර්ගස්ථ මුදල් රක්ෂණය	9	10
පුවත්පත් හා වාර ප්‍රකාශන	-	4
රසායනාගාර උපකරණ	60	218
තැපැල් හා දුරකතන	-	5
කාර්යාල උපකරණ නඩත්තු	80	122
ආදායම් බලපත්‍ර හා රක්ෂණය	114	246
එකතුව	**414**	**830**

මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්

සටහන් අංක : 09

පිරිවැය	**2019.01.01** දිනට ශේෂය රු.**000'**	එකතු කිරීම් රු.**000'**	ඉවත්කිරීම් / ගැලපීම් රු.**000'**	**2019.12.31** දිනට ශේෂය රු.**000'**
ඉඩම්	1,897	-	-	1,897
ගොඩනැගිලි	6,258	-	-	6,258
මෝටර් වාහන	130,596	-	-	130,596
යන්ත්‍රෝපකරණ	217,964	273,783	-	491,747
රසායනාගාර උපකරණ	21,565	99,517	(12)	121,070
ලීබඩු, සවිකිරීම් හා කාර්යාල උපකරණ	13,474	12,078	-	25,552
පරිගණක හා උපාංග	7,901	2,655	-	10,556
විද්‍යාත්මක උපකරණ	86,358	1,072	-	87,430
ගොඩනැගිලි (කෙරීගෙන යන වැඩ)	1,384	2,163	-	3,547
මුළු එකතුව	**487,397**	391,268	(12)	**878,653**

ක්ෂය කිරීම්	**2019.01.01** දිනට ශේෂය **රු.000'**	වර්ෂය තුල එකතු කිරීම් **රු.000'**	අපහරණය / ගැලපීම් **රු.000'**	**2019.12.31** දිනට ශේෂය **රු.000'**
ගොඩනැගිලි	627	313		940
මෝටර් වාහන	53,044	32,627	-	85,671
යන්ත්‍රෝපකරණ	85,046	76,367	-	161,413
රසායනාගාර උපකරණ	11,421	5,511	(9)	16,923
ලීබඩු, සවිකිරීම් හා කාර්යාල උපකරණ	-	1,469	-	1,469
පරිගණක හා උපාංග	2,907	1,742	-	4,649
විද්‍යාත්මක උපකරණ	15,443	17,307	-	32,750
මුළු එකතුව	**168,488**	135,336	**(9)**	**303,815**
ශුද්ධ පොත් අගය	**318,909**			**574,838**

01. මූල්‍ය කාර්ය සාධනයෙහි ඇතුලත් ක්ෂයවීම් පහත සඳහන් පරිදි සිදුකර ඇත.

ක්ෂය කිරීම්	වර්ෂය සඳහා අය කිරීම්	වර්ෂය සඳහා විලම්භිත ආදායම	අනාවරණය කරන ලද අගය
	රු. 000'	රු. 000'	රු. 000'
	313		313
	32,627	29,029	3,598
	76,367	76,287	80
	5,511	4,384	1,127
ලීබඩු, සවිකිරීම් හා කාර්යාල උපකරණ	1,469	249	1,220
	1,742	426	1,316
විද්‍යාත්මක උපකරණ	17,307	15,457	1,850
මුළු එකතුව	135,336	125,832	9,504

02 චාර්ෂික බදු කුලී ගෙවීමේ පදනම මත බදු ගිවිසුමක් කොරකහවැව පුහුණු මධ්‍යස්ථානයේ ඉඩමට ඇත. (හෙක්ටයාර් 2.166)

03 වර්ෂ 30 ක කාලයක් සඳහා නාමික කුලී ගෙවීම් පදනම මත බත්තරමුල්ලේ පිහිටි පර්චර්ස් 40.0 ක ඉඩමක් නාගරික සංවර්ධන අධිකාරිය විසින් ජල සම්පත් මණ්ඩලය වෙත පවරා ඇත.

04 2019.12.31 දිනට නෛතික හිමිකමක් නොමැතිව මණ්ඩලය විසින් ප්‍රයෝජනයට ගනු ලබන ඉඩම් හා ගොඩනැගිලි වල විස්තර පහත පරිදි වේ.

ඉඩම්	**ගොඩනැගිලි (දළ වශයෙන්)**
ප්‍රධාන කාර්යාලය	හෙක්ටයාර්. 0.2167
රත්මලාන යාන්ත්‍රික වැඩපල	හෙක්ටයාර්. 1.79378
අනුරාධපුර සංචාරක නිවාසය	හෙක්ටයාර්. 0.0759
වවුනියා වැඩබිම	හෙක්ටයාර්. 0.1050

05. දේපල පිරියත වර්ෂය තුලදී මිලදී ගත් වත්කම්/ප්‍රදානය කරන ලද වත්කම් ගණනය කරන තාක් හඳුනාගත් උපකරණ ප්‍රත්‍යාගණනය කරන ලද වටිනාකම් ගැලපීම් තුල සාධාරණ අගයන් සටහන් අංක 09 හි එකතු කිරීම් යටතේ දක්වා ඇත.

මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්

සටහන් අංක : 10	සත්‍ය 2019 රු.000'	සත්‍ය 2018 රු.000'
වෙළඳ ණයහිමියෝ	-	-
වෙළඳ ණයහිමියෝ	-	-
එකතුව		

සටහන් අංක : 11		
වෙනත් වෙන් කිරීම් හා ගෙවිය යුතු දෑ	627	523
(1) විගණන ගාස්තු සඳහා වෙන්කිරීම්	-	(57)
(2) සේ. ඇ . අරමුදල 10%	8,774	9,676
(3) ගෙවිය යුතු වියදම්	21	72
(4) ටෙන්ඩර් සුරැකුම් හා ආපසු ගෙවන තැන්පත්	250	4,908
(5) වෙනත් ගෙවීම්	-	172
(6) සේවක ණය හිමියෝ	49	11
(7) රදවාගත් මුදල්	9,701	15,305
උප එකතුව (1 - 7)	-	(67)
(8) අඩු කලා : එකතු කල අගය මත බදු මුදල්	9,701	15,238

සටහන් අංක : 12		
විලම්බිත ආදායම්	691	-
ජල මාපක අත්තිකාරම්	1,053	-
යෝග්‍යතා සහතික අත්තිකාරම්	14,175	36,330
සේවා අත්තිකාරම්	15,919	36,330

සටහන් අංක : 13		
සේවක ප්‍රතිලාභ	රු'000	රු'000
13.1 ව්‍යවස්ථාපිත දායක සැලසුම්		

සේවක අර්ථසාධක අරමුදල සඳහා වර්ෂය තුලදී පහත සඳහන් පරිදි දායක මුදල් ගෙවා ඇත.

සේවක අර්ථසාධක අරමුදල		
සේවය දායකත්වය - 12%	16,105	15,627
සේවක දායකත්වය - 10%	13,421	13,447
සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල - 3%	4,026	3,907

13.2 විශ්‍රාම ප්‍රතිලාභ සැලැස්ම

වර්ෂය ආරම්භක දිනට ව්‍යවස්ථාපිත ප්‍රතිලාභ බැඳීම්	68,219	67,422
කාලච්ඡේදය සඳහා පොළී පිරිවැය	7,845	-
ප්‍රවර්තන සේවා පිරිවැය	4,914	4,271
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම මත වූ (ලාභ/අලාභ)	798	-
වර්ෂය තුල ප්‍රතිලාභ ගෙවීම්	(7,539)	(13,157)
ගෙවිය යුතු ප්‍රතිලාභ	(956)	(855)
වර්ෂය තුල හදුනාගත් වෙන් කිරීම්	-	10,538
	73,281	**68,219**

13.2.1 වර්ෂය තුළ ආදායම් ප්‍රකාශනයට හඳුනාගත් වියදම්

ප්‍රවර්තන සේවා පිරිවැය	4,914	4,271
කාලච්ඡේදය සඳහා පොළී පිරිවැය	7,845	-
ප්‍රතිලාභ බැඳීම් අයකිරීම්	-	10,538
	12,759	**14,809**
හිමිකම් ප්‍රකාශය - (පිටු අංක 03 බලන්න)		
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම මත වූ ලාභ/(අලාභ)	(798)	-

13.2.2

විශ්‍රාම ප්‍රතිලාභ ගණනය කිරීම වෘත්තිය සුදුසුකම් ලත් ආයතනයක් වන ඇක්චුවරියල් සහ කළමනාකරණ උපදේශයක (පුද්) සමාගමේ පුපලනාදන් මහතා විසින් සහතික කරන ලදි. පහත සඳහන් උපකල්පන තක්සේරු කරු විසින් සේවක ප්‍රතිලාභ බැඳීම් ගණනය කිරීමේදී සැලකිල්ලට ගෙන ඇත.

වට්ටම් අනුපාතය	10.5%	(වාර්ෂික)	(2018 වර්ෂය - 11.5%)
වැටුප් වර්ධක අනුපාතිකය	9.0%	(වාර්ෂික)	(2018 වර්ෂය - 10.0%)
සේවක පිරිවැටුම් අනුපාතිකය	8.0%	(වාර්ෂික)	(2018 වර්ෂය - 8.0%)

ජල සම්පත් මණ්ඩලය

13.2.3 විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම

අනාගත ආයු කාලය සඳහා වූ උපකල්පන සැලකිල්ලට ගැනීමේදී ලන්ඩන් හි තක්සේරුකාර ආයතනය විසින් නිකුත්කරන ලද අංක A 1967/70 දරණ වගු චක්‍රය අදාල කර ගෙන ඇත.

මෙහිදී පුද්ගල විශ්‍රාම වයස අවුරුදු 60 ක් ලෙස හා අවුරුදු 60 සම්පූර්ණ වන උපන් දිනය සාමාන්‍ය විශ්‍රාමික වයස ලෙස සැලකිල්ලට ගෙන ඇත.

වර්ෂ 1983 අංක 12 දරණ විශ්‍රාමික පාරිතෝෂික ගෙවීම් පනත ප්‍රකාරව අඛන්ඩව වර්ෂ 05ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීමද අවශ්‍ය සාධකයක් වේ.

13.2.4 සංවේදීතා විශ්ලේෂණය

අනිකුත් උපකල්පිත සාධක නොවෙනස්ව තිබියදී විචලනයන් සඳහා 1% ක අනුපාතිකයක් මත පහත පරිදි සේවක ප්‍රතිලාභ සඳහා වූ බලපෑම සිදුවේ.

	2019	
	වැඩිවීම +1% රු.**'000'**	අඩු වීම -1% රු.**'000'**
වට්ටම් අනුපාතිකය	69,957	76,971
වැටුප් වර්ධක අනුපාතිකය	77,202	69,691

	2019 රු.'000	2018 රු.'000
විලම්බිත ආදායම්	537,601	277,654

(විස්තරාත්මක තොරතුරු සඳහා පිටු අංක 21 බලන්න)

සටහන් අංක 15

ස්කන්ධය / ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සඳහා කරුණාකර මෙහි පිටු අංක 03 බලන්න.

			වර්ෂය සඳහා අය කිරීම්		
	2019.01.01 දිනට ශේෂය	වර්ෂය තුළ එකතු කිරීම්	ක්ෂය වීම් රු. **000**	ප්‍රත්‍යාගණන ගැලපීම්/ ඉවත් කිරීම්	2019.12.31 දිනට ශේෂය
ඉඩම්	-				-
ගොඩනැගිලි	-				-
මොටර් වාහන	**70,346**	-	(**29,029**)		**41,317**
යන්ත්‍ර උපකරන	132,**745**	273,**641**	(**76,287**)		330,099
රසායනාගාර උපකරන	**7,743**	**99,320**	(**4,396**)		102,667
ලී බඩු සවිකිරීම් හා කාර්යාල උපකරණ	1,**888**	1**0,670**	(2**49**)		12,309
පරිසණක හා උපාන්ග	1,**410**	1,11**0**	(**426**)		2,094
විද්‍යාත්මක උපකරණ	**63,522**	1,**049**	(12,**456**)		49,115
මුළු එකතුව	**277,654**	**385,790**	(**125,843**)	-	537,601

දේපල පිරියත උපකරණ සඳහා වූ සාධරණ අගයෙහි බලපෑම

	2018 වරර්ෂය රු. 000	2018 වරර්ෂය ඌණතාවය රු. 000	2017 වරර්ෂය ඌණතාවය රු. 000	2016 වර්ෂය	
				අතිරිත්තය රු. 000	ඌනතාවය රු. 000
මොටර් වාහන	-	-	-	916	-
යන්ත්‍ර උපකරණ	-	-	-	-	5,317
රසායනාගාර උපකරණ	-	-	-	-	631
ලී බඩු සවි කිරීම්	-	3,228	-	-	-
පරිගණක හා උපාංග	-	-	-	256	-
විද්‍යාත්මක උපකරණ	-	-	242	-	-
මුළු එකතුව	-	3,228	242	1,172	**5,948**



විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } අයිඊඑන්/ජ/ඩබ්ආර්බී/2020/13 මබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2020 ජූලි ෂ්ඨ දින

CHAIRMAN
WATER RESOURCES BOARD

සභාපති

ජල සම්පත් මණ්ඩලය

ජල සම්පත් මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජල සම්පත් මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශ ගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිඹිබු කරන බවට මා දරන්නා වූ මතය වේ.

1.2 නත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ඉකුත් වර්ෂයේ වැරදි නිවැරදි කිරීම් ලෙස සමාලෝචිත වර්ෂය තුළදී ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට රු. මිලියන 3.93 ක ගැලපීම් සිදුකර තිබුණද, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 3 ප්‍රකාරව එම ගැලපීම් අතීතානුයෝගීව ගලපා ඉකුත් වර්ෂයේ සංසන්දනාත්මක තොරතුරු නැවත ප්‍රතිඉදිකිරීමක් කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණු අතර අදාළ ගැලපීම්වල විස්තර අනාවරණය කරද නොතිබුණි.

(ආ) මණ්ඩලය ආරම්භ කිරීම සඳහා රජයේ ප්‍රාග්ධනය සම්පාදනය කරදී තිබුණද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 1 ට අනුව රජයෙන් ලබා දී තිබුණු අදාළ ප්‍රාග්ධන දායකය හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණු අතර ඒ වෙනුවට සමුච්චිත අරමුදල (Accumulated Fund) ලෙස රු. මිලියන 256 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) වර්ෂ 03 කට පෙර භාවිතයෙන් ඉවත් කර තිබුණු පිරිවැය රු. මිලියන 5.8 ක්වූ විදුම් යන්ත්‍ර 06 ක් භාවිතයෙන් ඉවත් කර තිබුණද එම යන්ත්‍රවල වටිනාකම ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු නොකර යන්ත්‍ර හා උපකරණ ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) මණ්ඩලයේ අවසන් තොගය ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංක 9 අනුව පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධිත අගයමත වටිනාකම යන දෙකෙන් අඩු අගයට පෙන්නුම් කළ යුතු වුවද භාවිතයෙන් ඉවත්කර තිබුණු යන්ත්‍රවලට අදාල රු.මිලියන 4.31 ක් වූ අමතර කොටස් තොගයෙහි ශුද්ධ උපලබ්ධිත අගය ගණනය කිරීමකින් තොරව එහි පිරිවැය මත අගය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඉ) ඉදිකිරීම් කටයුතු අවසන් කර තිබුණු නළ ලිං 03 ක වටිනාකම වූ රු. 498,000 ක් මණ්ඩලයේ ආදායම් හඳුනාගැනීමේ ගිණුම් ප්‍රතිපත්තිය අනුව සමාලෝචිත වර්ෂයේදී ආදායමට ඇතුලත් කිරීමට කටයුතු කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ

තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහඟරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම් ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම්, චේතනාන්විත මඟහැරීම් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම් වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිතා හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරවිකිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවිකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ මතය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	විස්තරය
(අ) අංක 2010/23 සහ 2017 මාර්තු 16 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය	(i) කෘෂිකාර්මික කටයුතු සඳහා ඉදි කරනු ලබන විශ්කම්භය මීටර් 4 ක් හෝ ඊට වැඩි වගා ළිං, වාණිජමය කෘෂිකාර්මික කටයුතු සහ කර්මාන්ත අවශ්‍යතා සඳහා ඉදි කරනු ලබන නළ ළිං සඳහා ජල සම්පත් මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. තවද නළ ළිං ඉදිකරන සියළු ආයතන මණ්ඩලයේ ලියාපදිංචි විය යුතු වුවත් ඇතැම් ආයතන එසේ ලියාපදිංචි වී නොතිබුණි.
	(ii) වාණිජමය කෘෂිකර්මාන්තය සඳහා හෝ කර්මාන්ත සඳහා මසකට ලීටර් 30,000 ක භූගත ජලය ලබා ගන්නා සියළුම ව්‍යාපෘති සඳහා අදාළ ජල ප්‍රභවය සම්බන්ධ තත්ත්ව වාර්තා නිකුත් කර නොතිබුණි.
	(iii) ගැසට් පත්‍රයේ 3 වගන්තිය ප්‍රකාරව අදාළ විශ්ලේෂණ වාර්තා අනුමැතිය සඳහා ජල සම්පත් මණ්ඩලය වෙත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.
	(iv) ගැසට් නිවේදනයේ 2 වගන්තිය අනුව දෛනිකව ලබාගන්නා ජල පරිමාණයන් පිළිබඳ දත්තයන් පවත්වාගත යුතු වුවත් ඇතැම් පෞද්ගලික ආයතනයන් එසේ කටයුතු කර නොතිබුණු අතර ඒ සම්බන්ධයෙන් මණ්ඩලය කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 104 ඉකුත් වර්ෂයේ සිට පැවත එන රු.118,000 ක් වූ තොග ඌනතාවය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 අනුව කටයුතු කර නොතිබුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) ජල සම්පත් මණ්ඩලයට අයත් වාහන 30 ක් සඳහා වාහන ලුහුබැඳීමේ යන්ත්‍ර (Vehicle traking Solution) සපයා සවි කිරීම සඳහා රු. මිලියන 1.419 ක වටිනාකමකට 2019 සැප්තැම්බර් 18 දින ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුම ප්‍රකාරව අදාළ යන්ත්‍ර 2019 ඔක්තෝබර් 02 වන දින වන විට සවි කළ යුතුව තිබුණද 2020 ජූනි 18 දින වන විටත් අදාළ පිරිවිතරයන්ට අනුකූලව සවිකිරීම් සිදුකර නොතිබුණි. කොන්ත්‍රාක්කරු ගිවිසුම ප්‍රකාරව කටයුතු නොකිරීම සම්බන්ධයෙන් 2020 ජූනි 20 දක්වා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) මණ්ඩලය විසින් රු.මිලියන 2.640 කට මිලදීගෙන තිබුණු විදුලි ජනක යන්ත්‍ර 11 ක් හා රු.මිලියන 2.250 කට මිලටගෙන තිබුණු විදුලි ජනක යන්ත්‍ර 03 ක් වර්ෂ තුනකට වැඩි කාලයක සිට කිසිදු ප්‍රයෝජනයකට නොගෙන ගබඩාවේ රඳවා ගෙන තිබුණි. තවද, එම යන්ත්‍ර වල වගකීම් කාලය ද අවසන්වී තිබුණු අතර එම යන්ත්‍ර භාවිතයට ගැනීම සඳහා විකල්ප ක්‍රියාමාර්ග සලකා බැලීමක්ද කර නොතිබුණි.

(ඇ) මණ්ඩලය සතුව භාවිතයට ගත හැකි විදුම් යන්ත්‍ර කිහිපයක් නිෂ්කාර්යව ගබඩා කර තිබියදී සහ 2016 වර්ෂය සමග සැසඳීමේදී නළ ලිං ඉදිකිරීමේ කටයුතුවල පහළ යාමක් තිබියදී, එම තත්ත්වය පිළිබඳ නොසළකා අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත රු.මිලියන 280 ක් වැයකර සමාලෝචිත වර්ෂයේදී නව විදුම් යන්ත්‍රයක් හා උපකරණ මිලට ගෙන තිබුණි. එම විදුම් යන්ත්‍රයද මිලට ගත් දින සිට මාස 08 පමණ කාලයක් නිෂ්කාර්යව තිබුණි.

03. වෙනත් විගණන නිරීක්ෂණ

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට තනතුරු 64 ක් සඳහා සේවකයින් 413 දෙනෙකු අනුමත කර තිබුණද ඉන් තනතුරු 46 ක සේවකයින් 140 ක් පුරප්පාඩුව පැවතුණි. මෙම පුරප්පාඩු වර්ෂ කිහිපයක සිට පැවතියද 2020 ජූනි මස වන විටත් බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) නාගරික සංවර්ධන අධිකාරියට අයත් ජල සම්පත් මණ්ඩලයේ ප්‍රධාන කාර්යාල භූමිය, චාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් රත්මලාන යාන්ත්‍රික වැඩපල පිහිටි භූමිය හා අලුත්නුවර ප්‍රාදේශීය ලේකම්ට අයත් අනුරාධපුර අලුත්නුවර පිහිටි සංචාරක නිවාසය අයත් භූමිය ජල සම්පත් මණ්ඩලය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) අමාත්‍යාංශයේ ප්‍රතිපාදනවලින් 2017 වර්ෂයේ මැයි මස 31 දින ජල සම්පත් මණ්ඩලයේ භාවිතය සඳහා ජල පොම්ප 50 ක් රු.මිලියන 8.94 කට මිලදී ගෙන තිබුණි. එහි වගකීම් කාලය වර්ෂ 02 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විට ජල මෝටර් 50 න් 06 ක් පමණක් භාවිතය සඳහා යොදාගෙන තිබුණි. ජල පොම්ප 44 ක වගකීම් කාලය භාවිතයකින් තොරව ගබඩාවේදීම ඉකුත් වී තිබුණු අතර එම යන්ත්‍ර භාවිතය පිළිබඳව විකල්ප ක්‍රියාමාර්ගයකට එළඹ නොතිබුණි. එසේම 2009 වර්ෂයේ දී සමාජ සේවා දෙපාර්තමේන්තුවෙන් ලැබී තිබුණු අගල් 1 ½ ජල පොම්ප 50 ක් භාවිතා කිරීමකින් තොරව සහ එම යන්ත්‍රවල සක්‍රීය බව හෝ අක්‍රීය බව පරීක්ෂා කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ගබඩාවේ නිශ්කාර්යව රඳවාගෙන තිබුණි.

(ඈ) ජල සම්පත් මණ්ඩලයේ පලාත් බල ප්‍රදේශය තුළ ජල සම්පත් මණ්ඩලයේ අනුමැතිය යටතේ ඉදිකරන ලද ළිං සම්බන්ධයෙන් එම ළිංවල පිහිටි ප්‍රදේශය පැහැදිලිව හඳුනාගත හැකිවන පරිදි (GPS) බණ්ඩාංක ඇතුළත් සිතියමක් පලාත් කාර්යාල තුළ ස්ථාපිත කර නොතිබුණු අතර එම ළිං පිළිබඳව තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් ස්ථාපිත කර නොතිබුණි.

(ඉ) පුත්තලම ජල පරීක්ෂණාගාරය තුළ ස්ථාපිත කර තිබුණු ක්ෂුද්‍ර ජීවී විද්‍යා රසායනාගාරය තුළ (Microbiology Laboratory) වෙලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම් ව්‍යාපෘතිය මගින් ලබා දී තිබූ රසායනාගාර උපකරණ වර්ග 05 කට අයත් ඒකක 06 ක් වසර 06 කට අධික කාලයක සිට රසායනාගාරය තුළ නිෂ්කාර්යව පැවති අතර අදාළ රසායනාගාරය මගින් 2014 දෙසැම්බර් සිට රසායනාගාර වාර්තා නිකුත් කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසානයට ණයගැති ශේෂ වටිනාකම වූ රු.20,502,733 කින් රු.7,603,424 ක් වර්ෂයකට වඩා පැරණි ණය ශේෂ වූ අතර එම ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න,
විගණකාධිපති.

විගණකාධිපති වාර්තාව

විගණන නිරීක්ෂණය	
1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම (අ) ඉකුත් වර්ෂයේ වැරදි නිවැරදි කිරීම් ලෙස සමාලෝචිත වර්ෂය තුළදී ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට රු. මිලියන 3.93 ක ගැලපීම් සිදුකර තිබුණද, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 3 ප්‍රකාරව එම ගැලපීම් අතීතානුයෝගීව ගලපා ඉකුත් වර්ෂයේ සංසන්දනාත්මක තොරතුරු නැවත ප්‍රතිෂ්ඨාපනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණු අතර අදාළ ගැලපීම්වල විස්තර අනාවරණය කරද නොතිබුණි.	2020 වර්ෂයේ ගිණුම් ඉදිරිපත් කිරීමේදී ප්‍රතිෂ්ඨාපනය කරණ ලද (Restated) ප්‍රකාශන ලෙස ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.
(ආ) මණ්ඩලය ආරම්භ කිරීම සඳහා රජයේ ප්‍රාග්ධනය සම්පාදනය කරදී තිබුණද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 1 ට අනුව රජයෙන් ලබා දී තිබුණු අදාළ ප්‍රාග්ධන දායකය හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණු අතර ඒ වෙනුවට සමුච්චිත අරමුදල (ජජමපමක්එා ඝබා) ලෙස රු. මිලියන 256 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.	''සමුච්චිත අරමුදලී ලෙස හැඳින්වූ ගිණුම "සහභාගී වූ ප්‍රාග්ධනයි.'' (Contributed Capital) ලෙස සංශෝධනය කිරීමට කටයුතු කරන ලදී. ඒ අනුව 2020 වර්ෂයේ සිට මූල්‍ය තත්ව ප්‍රකාශයෙහි ඒ ලෙසින් දැක්වීමට කටයුතු කල හැකිවේ.
(ඇ) වර්ෂ 03 කට පෙර භාවිතයෙන් ඉවත් කර තිබුණු පිරිවැය රු. මිලියන 5.8 ක්වූ විදුම් යන්ත්‍ර 06 ක් භාවිතයෙන් ඉවත් කර තිබුණද එම යන්ත්‍රවල වටිනාකම ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු නොකර යන්ත්‍ර හා උපකරණ ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.	භාවිතයට ගත නොහැකි විදුම් යන්ත්‍ර 03 මෙම වර්ෂයේදී ටෙන්ඩර් කැඳවීම මඟින් අපහරණය කිරීම සඳහා යොමු කර ඇත.
(ඈ) මණ්ඩලයේ අවසන් තොගය ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංක 9 අනුව පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධිත අගයමත වටිනාකම යන දෙකෙන් අඩු අගයට පෙන්නුම් කළ යුතු වුවද භාවිතයෙන් ඉවත්කර තිබුණු යන්ත්‍රවලට අදාල රුපියල් මිලියන 4.31 ක් වූ අමතර කොටස් තොගයෙහි ශුද්ධ උපලබ්ධිත අගය ගණනය කිරීමකින් තොරව එහි පිරිවැය මත අගය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.	මණ්ඩලය වෙත විදුම් යන්ත්‍ර සමග අමතර කොටස් ලැබුණු අතර ඒවා වෙළඳ පොලේ සුලබව නොමැති හෙයින් ශුද්ධ උපලබ්ධි අගයන් ගණනය කිරීම අසීරු වී ඇත.තවද මෙම අමතර කොටස් එම යන්ත්‍ර අලුත්වැඩියාවන්හිදී භාවිතා කිරීමට තබාගනු ලබන ඒවා වේ.

(ඉ) ඉදිකිරීම් කටයුතු අවසන් කර තිබුණු නළ ලිං 03 ක වටිනාකම වූ රු. 498.000 ක් මණ්ඩලයේ ආදායම් හඳුනාගැනීමේ ගිණුම් ප්‍රතිපත්තිය අනුව සමාලෝචිත වර්ෂයේදී ආදායමට ඇතුලත් කිරීමට කටයුතු කර නොතිබුණි.	ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇත.
2. නීතිරීති / විධානයට යොමුව (අ) අංක 2010/23 සහ 2017 මාර්තු 16 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය (i) කෘෂිකාර්මික කටයුතු සඳහා ඉදි කරනු ලබන විශ්කම්භය මීටර් 4 ක් හෝ ඊට වැඩි වගා ළිං, වාණිජමය කෘෂිකාර්මික කටයුතු සහ කර්මාන්ත අවශ්‍යතා සඳහා ඉදි කරනු ලබන නළ ලිං සඳහා ජල සම්පත් මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. තවද නළ ලිං ඉදිකරන සියළු ආයතන මණ්ඩලයේ ලියාපදිංචි විය යුතු වුවත් ඇතැම් ආයතන එසේ ලියාපදිංචි වී නොතිබුණි. (ii) වාණිජමය කෘෂිකර්මාන්තය සඳහා හෝ කර්මාන්ත සඳහා මසකට ලීටර් 30,000 ක භූගත ජලය ලබා ගන්නා සියළුම ව්‍යාපෘති සඳහා අදාළ ජල ප්‍රභවය සම්බන්ධ තත්ත්ව වාර්තා නිකුත් කර නොතිබුණි. (iii) ගැසට් පත්‍රයේ 3 වගන්තිය ප්‍රකාරව අදාළ විශ්ලේෂණ වාර්තා අනුමැතිය සඳහා ජල සම්පත් මණ්ඩලය වෙත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. (iv) ගැසට් නිවේදනයේ 2 වගන්නිය අනුව දෛනිකව ලබාගන්නා ජල පරිමාණයන් පිළිබඳ දත්තයන් පවත්වාගත යුතු වුවත් ඇතැම් පෞද්ගලික ආයතනයන් එසේ කටයුතු කර නොතිබුණු අතර ඒ සම්බන්ධයෙන් මණ්ඩලය කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	2010/23 සහ 2017.03.16 ගැසට් පත්‍රයට අනුව දැනට මණ්ඩලය මගින් ආවරණය නොකළ කෘෂිකාර්මික ළිං ඇතුළු අනෙකුත් නියාමන කටයුතු ක්‍රියාත්මක කිරීමට පහත සඳහන් අංශ වැඩිදියුණු කිරීමට සැලසුම් සකස්කොට ඇත. 01. ආයතනයේ, අවශ්‍ය, යටිතල, පහසුකම් වැඩිදියුණු කිරීම. 02. අවශ්‍ය, තාක්ෂණික, කාර්යමණ්ඩලය, බඳවා ගැනීම. 03. මණ්ඩලය, සතු, ප්‍රාදේශීය මට්ටමේ කාර්යාල, ව්‍යූහය, වැඩිදියුණු කිරීම. 04. දැනට පවතින රාජ්‍ය යාන්ත්‍රණය සැලකිල්ලට, ගෙන, දිස්ත්‍රික්, ලේකම්, ප්‍රාදේශීය ලේකම්, ජල, සම්පාදන අමාත්‍යාංශය, යටතේ, පවතින අනෙකුත් ආයතන සම්බන්ධ වී 2021 වර්ෂයේදී භූගත ජල නියාමන කටයුතු නිසියාකාරව සිදු කිරීමට අවශ්‍ය ක්‍රමවේද වැඩිදියුණු කිරීමට කටයුතු යොදනු ලැබේ.
(ඇ) මුදල් රෙගුලාසි 104 ඉකුත් වර්ෂයේ සිට පැවත එන රු.118,000 ක් වූ තොග ඌනතාවය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 අනුව කටයුතු කර නොතිබුණි.	තොග ඌනතාවය සම්බන්ධයෙන් විමර්ශන කටයුතු අවසන් වී ඇති බැවින් මුදල් රෙගුලාසිවලට අනුව කටයුතු කිරීමට සටහන් කර ගනිමි.

(අ) ජල සම්පත් මණ්ඩලයට අයත් වාහන 30 ක් සඳහා වාහන ලුහුබැඳීමේ යන්ත්‍ර (Vehicle traking Solution) සපයා සවි කිරීම සඳහා රු. මිලියන 1.419 ක වටිනාකමකට 2019 සැප්තැම්බර් 18 දින ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුම ප්‍රකාරව අදාළ යන්ත්‍ර 2019 ඔක්තෝබර් 02 වන දින වන විට සවි කළ යුතුව තිබුණද 2020 ජූනි 18 දින වන විටත් අදාළ පිරිවිතරයන්ට අනුකූලව සවිකිරීම් සිදුකර නොතිබුණි. කොන්ත්‍රාත්කරු ගිවිසුම ප්‍රකාරව කටයුතු නොකිරීම සම්බන්ධයෙන් 2020 ජූනි 20 දක්වා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	කොන්ත්‍රාත්කරු ලවා අදාල කාර්යය නිසිපරිදි ඉටු කර ගැනීම සඳහා මොරටුව විශ්ව විද්‍යාලයේ ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු තාක්ෂණය පිළිබඳව ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකුගේ උපදෙස් ලබා ගෙන අදාල කොන්ත්‍රාත්කරු වෙත අවශ්‍ය වැඩ පිළිවෙලක් ඉදිරිපත් කර ඇත.
(ආ) මණ්ඩලය විසින් රු.මිලියන 2.640 කට මිලදීගෙන තිබුණු විදුලි ජනක යන්ත්‍ර 11 ක් හා රු.මිලියන 2.250 කට මිලටගෙන තිබුණු විදුලි ජනක යන්ත්‍ර 03 ක් වර්ෂ තුනකට වැඩි කාලයක සිට කිසිදු ප්‍රයෝජනයකට නොගෙන ගබඩාවේ රඳවා ගෙන තිබුණි. තවද, එම යන්ත්‍ර වල වගකීම් කාලය ද අවසන්වී තිබුණු අතර එම යන්ත්‍ර භාවිතයට ගැනීම සඳහා විකල්ප ක්‍රියාමාර්ග සලකා බැලීමක්ද කර නොතිබුණි.	අදාල අංශ වලට දැනට පවතින හා ඉදිරියේදී මිලදී ගනු ලබන වත්කම් කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනයට අවශ්‍ය කටයුතු යොදනු ලැබේ. තවද මීට පෙර විගණනය මඟින් පෙන්වා දුන් පරිදි වාරිමාර්ග අමාත්‍යාංශයේ, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හා ජල සම්පත් මණ්ඩලයේ නිලධාරීන් සම්බන්ධ වී මෙම උපකරණ පරීක්ෂා කර භාවිතා කල හැකි උපකරණ කොටසක් වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙතද අනෙකුත් උපකරණ ජල සම්පත් මණ්ඩලයේ ඉදිරි ප්‍රයෝජනය සඳහාද යෙදවීමට කටයුතු යොදා ඇත.මේ පිළිබඳව වාරිමාර්ග අමාත්‍යාංශයේ විගණන කමිටුවෙන් ලබා දුන් උපදෙස් අනුව තවදුරටත් කටයුතු කරනු ලැබේ.
(ඇ) මණ්ඩලය සතුව භාවිතයට ගත හැකි විදුම් යන්ත්‍ර කිහිපයක් නිෂ්කාර්යව ගබඩා කර තිබියදී සහ 2016 වර්ෂය සමග සැසඳීමේදී නළ ලිං ඉදිකිරීමේ කටයුතුවල පහළ යාමක් තිබියදී, එම තත්ත්වය පිළිබඳ නොසළකා අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත රු.මිලියන 280 ක් වැයකර සමාලෝචිත වර්ෂයේදී නව විදුම් යන්ත්‍රයක් හා උපකරණ මිලට ගෙන තිබුණි. එම විදුම් යන්ත්‍රයද මිලට ගත් දින සිට මාස 08 පමණ කාලයක් නිෂ්කාර්යව තිබුණි.	මෙම විදුම් යන්ත්‍රය 2019 ඔක්තෝම්බර් මාසයේ සිට විදුම් කටයුතු සඳහා ඵලදායීව යොදා ගෙන ඇත.මේ වන විට මෙම විදුම් යන්ත්‍රයෙන් නළ ළිං 19ක් ඉදිකර ඇති විදුම් කර ඇති මුළු ගැඹුර මීටර 883 කි.මෙම විදුම් යන්ත්‍රයෙන් ඉදිරි මාස දෙක තුල නුවරඑලිය දිස්ත්‍රික්කයේ ගැඹුරු නළ ළිං 6ක් විදුම් කිරීමට නියමිතව ඇත.

3. වෙනත් විගණන නිරීක්ෂණ	
(අ) සමාලෝචිත වර්ෂය අවසානයට තනතුරු 64 ක් සඳහා සේවකයින් 413 දෙනෙකු අනුමත කර තිබුණද ඉන් තනතුරු 46 ක සේවකයින් 140 ක් පුරප්පාඩුව පැවතුණි. මෙම පුරප්පාඩු වර්ෂ කිහිපයක සිට පැවතියද 2020 ජූනි මස වන විටත් බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත පුරප්පාඩු පවතින තනතුරු 110 ක් බඳවා ගැනීමට අනුමැතිය ලබා දෙන ලෙස ලිපි ඉදිරිපත් කරන ලද නමුත් අනුමත කර ඇත්තේ තනතුරු 14 ක් සඳහා පුරප්පාඩු 21 ක් පිරවීම සඳහා පමණි. එම තනතුරු පිරවීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.
(ආ) නාගරික සංවර්ධන අධිකාරියට අයත් ජල සම්පත් මණ්ඩලයේ ප්‍රධාන කාර්යාල භූමිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් රත්මලාන යාන්ත්‍රික වැඩපල පිහිටි භූමිය හා අලුත්නුවර ප්‍රාදේශීය ලේකම්ට අයත් අනුරාධපුර අලුත්නුවර පිහිටි සංචාරක නිවාසය අයත් භූමිය ජල සම්පත් මණ්ඩලය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	(i) ජල සම්පත් මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය පිහිටා තිබෙන භූමිය නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩමක් නොවන අතර එය තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් යටතේ තිබෙන රජයේ ඉඩමකි. එය කෙටි කාලීන බදු පදනම මත ජල සම්පත් මණ්ඩලයට ලබා දී ඇත. (ii) රත්මලාන යාන්ත්‍රික වැඩ බිමේ පිහිටි වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් ඉඩම නාගරික සංවර්ධන අධිකාරියේ නිවාස ව්‍යාපෘතියක් සඳහා වෙන් කරවා ගෙන ඇති අතර ඒ සඳහා විකල්ප ඉඩමක් හෝමාගම මහින්ද රාජපක්ෂ විද්‍යාලය අසලින් ලබා දීමට එකඟ වී ඇත. (iii) ජල සම්පත් මණ්ඩලයේ සංචාරක නිවාසය පිහිටි ඉඩම අලුත්නුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ඉඩමක් නොවන අතර නැගෙනහිර නුවර ගම්පළාතට අයත් ප්‍රදේශයක පිහිටි රජයේ ඉඩමකි. එය තිස් අවුරුදු බද්දකට 2016.08.26 දින ගැසට් පත්‍රයේ පළකර ලබා දී ඇත.
(ඇ) අමාත්‍යාංශයේ ප්‍රතිපාදනවලින් 2017 වර්ෂයේ මැයි මස 31 දින ජල සම්පත් මණ්ඩලයේ භාවිතය සඳහා ජල පොම්ප 50 ක් රුපියල් මිලියන 8.94 කට මිලදී ගෙන තිබුණි. එහි වගකීම් කාලය වර්ෂ 02 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විට ජල මෝටර් 50 න් 06 ක් පමණක් භාවිතය සඳහා යොදාගෙන තිබුණි. ජල පොම්ප 44 ක වගකීම් කාලය	අදාල අංශ වලට දැනට පවතින හා ඉදිරියේදී මිලදී ගනු ලබන වත්කම් කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනයට අවශ්‍ය කටයුතු යොදනු ලැබේ. තවද මීට පෙර විගණනය මඟින් පෙන්වා දුන් පරිදි වාරිමාර්ග අමාත්‍යාංශයේ, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හා ජල සම්පත් මණ්ඩලයේ නිලධාරීන් සම්බන්ධ වී මෙම උපකරණ පරීක්ෂා කර භාවිතා කල හැකි උපකරණ කොටසක් වාරිමාර්ග දෙපාර්ත

භාවිතයකින් තොරව ගබඩාවේදීම ඉකුත් වී තිබුණු අතර එම යන්ත්‍ර භාවිතය පිළිබඳව විකල්ප ක්‍රියාමාර්ගයකට එළඹ නොතිබුණි. එසේම 2009 වර්ෂයේ දී සමාජ සේවා දෙපාර්තමේන්තුවෙන් ලැබී තිබුණු අගල් 1 ඃ ජල පොම්ප 50 ක් භාවිතා කිරීමකින් තොරව සහ එම යන්ත්‍රවල සක්‍රීය බව හෝ අක්‍රීය බව පරීක්ෂා කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ගබඩාවේ නිශ්කාර්යව රඳවාගෙන තිබුණි.	මේන්තුව වෙතද අනෙකුත් උපකරණ ජල සම්පත් මණ්ඩලයේ ඉදිරි ප්‍රයෝජනය සඳහාද යෙදවීමට කටයුතු යොදා ඇත.මේ පිළිබඳව වාරිමාර්ග අමාත්‍යාංශයේ විගණන කමිටුවෙන් ලබා දුන් උපදෙස් අනුව තවදුරටත් කටයුතු කරනු ලැබේ.
(ඈ) ජල සම්පත් මණ්ඩලයේ පලාත් බල ප්‍රදේශය තුළ ජල සම්පත් මණ්ඩලයේ අනුමැතිය යටතේ ඉදිකරන ලද ළිං සම්බන්ධයෙන් එම ළිංවල පිහිටි ප්‍රදේශය පැහැදිළිව හඳුනාගත හැකිවන පරිදි (ඨඊ) ඛණ්ඩාංක ඇතුළත් සිතියමක් පලාත් කාර්යාල තුළ ස්ථාපිත කර නොතිබුණු අතර එම ළිං පිළිබඳව තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් ස්ථාපිත කර නොතිබුණි.	මේ පිලිබඳව පළාත් කළමනාකරු දැනුවත් කර ඇති අතර කොළඹ ප්‍රධාන කාර්යාලයේ පිහිටි භූගත ජල නියාමන ඒකකය හා සම්බන්ධ වෙමින් එම ප්‍රදේශ වල ජල සම්පත් මණ්ඩලය මගින් අනුමත කරන ලද නළ ළිං සම්බන්ධ තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් හා ඨඊ කණ්ඩාන්ඛ සහිත සිතියම් සකස් කිරීමට උපදෙස් ලබාදී ඇති අතර එය 2020 ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත්කර ක්‍රියාත්මක කිරීමට සැලසුම් සකස් කර ඇත.
(ඉ) පුත්තලම ජල පරීක්ෂණාගාරය තුළ ස්ථාපිත කර තිබුණු ක්ෂුද්‍ර ජීවී විද්‍යා රසායනාගාරය තුළ (Microbiology Laboratory) වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම් ව්‍යාපෘතිය මගින් ලබා දී තිබූ රසායනාගාර උපකරණ වර්ග 05 කට අයත් ඒකක 06 ක් වසර 06 කට අධික කාලයක සිට රසායනාගාරය තුළ නිෂ්කාර්යව පැවති අතර අදාළ රසායනාගාරය මගින් 2014 දෙසැම්බර් සිට රසායනාගාර වාර්තා නිකුත් කර නොතිබුණි.	අනුරාධපුර පළාත් කාර්යාලයේ රසායනාගාරය වෙත පුත්තලම රසායනාගාරයේ ක්ෂුද්‍රජීවී පරීක්ෂණ උපකරණය ස්ථාපනයට නියමිතව තිබුණු අතර ඊට අදාල තවත් අමතර උපකරණයන් කිහිපයක් අනුරාධපුර රසායනාගාරයට ලබාගැනීමට අවශ්‍ය වුවද භාණ්ඩාගාර ප්‍රතිපාදන ඌනතාවය මත එම උපකරණ ලබා ගැනීම සිදු නොකෙරුණි.එම අමතර උපකරණ නොමැතිව පුත්තලම උපකරණ අනුරාධපුර ස්ථාපනය කලද ක්ෂුද්‍රජීවී රසායනාගාරයේ සිදුකරන පරීක්ෂණ නිසි ක්‍රමවේදයට අනුව සිදුකල නොහැකි බැවින් අදාල අමතර උපකරණ ලබාගන්නා තුරු පුත්තලම උපකරණ අනුරාධපුර ස්ථාපනය ප්‍රමාද කර තිබේ.
(ඊ) සමාලෝචිත වර්ෂය අවසානයට ණයගැති ශේෂ වටිනාකම වූ රු.20,502,733 කින් රු.7,603,424 ක් වර්ෂයකට වඩා පැරණි ණය ශේෂ වූ අතර එම ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	2019.12.31 දිනට පැවති රු 20,502,733.04 ක ණයගැති ශේෂය 2020.10.15දින වන විට රු.9,000,606.52 දක්වා අඩුවී තිබුණි.තවදුරටත් අයකර ගත යුතු ණයගැති ශේෂ සම්බන්ධව කටයුතු කරගෙන යමින් පවතී.

2019 වර්ෂය තුල ජල සම්පත් මණ්ඩලය මගින් ක්‍රියාත්මක කල ව්‍යාපෘතීන්හි භෞතික ප්‍රගතියේ සාරාංශය

1. මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක භූගත ජල නිමාන ව්‍යාපෘති සහ අධ්‍යයන

- භූගත ජල කළමනාකරණයට අවශ්‍ය දිගුකාලීන දත්ත එක්රැස්කිරීම සඳහා වූ වැඩසටහන යටතේ කොළඹ සිට මීගමුව දක්වා දිවෙන වැලි සහිත නොගැඹුරු ජල ධරය පිළිබඳව සිදු කරන සවිස්තරාත්මක භූජල විද්‍යාත්මක අධ්‍යයනය, පුත්තලම ආශ්‍රිතව සිදු කරන භූජල විද්‍යාත්මක අධ්‍යයනය, කැලණි ගංගා ද්‍රෝණිය භූජල විද්‍යාත්මක අධ්‍යයනය, අනුරාධපුර දිස්ත්‍රික්කය තුල සිදු කරන දීර්ඝ කාලීන භූ ජල විද්‍යා අධ්‍යයනය, වව්නියා-කිලිනොච්චි ප්‍රදේශ ආවරණය කරමින් සිදු කරන භූ ජල විද්‍යාත්මක අධ්‍යයනය, මන්නාරම දිස්ත්‍රික්කයේ පවතින හුණු ගල් සහිත ජලධරය පිළිබඳව සිදු කරන භූ ජල විද්‍යාත්මක අධ්‍යයනය, කිරිඳි ඔය ජල ද්‍රෝණියේ පහළ ජල ධර ප්‍රදේශය භූජල අධ්‍යයනය සහ යාපන අර්ධද්වීපයේ ජලධරය පිළිබඳව සිදු කරන භූ ජල විද්‍යාත්මක අධ්‍යයනය යන පර්යේෂණ කටයුතු සඳහා ජල සාම්පල එක්රැස් කිරීම හා ජල මට්ටම් මිනුම් ගැනීම 2019 වර්ෂයේ ඉලක්කය 100% දක්වා සපුරා ඇති අතර ජල සාම්පල රසායනික විශ්ලේෂණය 2019 වර්ෂයේ ඉලක්කය 79% දක්වා සපුරා ඇත.

- කාලගුණික විපර්යාස නිසා භූගත ජලයට ඇතිවිය හැකි ඍජු හා වක්‍ර බැලපෑම පිළිබඳ අධ්‍යනය යටතේ කොළඹ සිට වැලිගම දක්වා දිවෙන බස්නිහිර වෙරළ තීරයේ දීර්ඝ කාලීන අධ්‍යයන සඳහා තෝරා ගන්නා ලද නොගැඹුරු නල ළිං 46කදි හා ඊසාන දිග වෙරළ තීරයේ දීර්ඝ කාලීන අධ්‍යයන සඳහා තෝරා ගන්නා ලද නොගැඹුරු නල ළිං 35 ක් (2019 වර්ෂයේ භූ ජල සමීක්ෂණ සිදුකර ඉදිකරන ලද නොගැඹුරු නල ළිං 10 ද ඇතුලත්ව) උපයෝගී කරගෙන ජල මට්ටම් මැනීම හා ජල නියැදි එකතු කිරීමසිදු කරන ලදි (මුළු නියැදි ගණන 81). එකතු කරන ලද ජල නියැදි රසායනික විශ්ලේෂණයට භාජනය කරන ලදි. එහිදි අවස්ථා දෙකකදි ක්ෂේත්‍රයේදි ජලයේ ගුණාත්මකභාවයත් පරාමීතීන් හතරක් (PH, TDS, Salinity) මනින ලදි. අවස්ථා දෙකකදි ජල සාම්පල රසායනික පරීක්ෂණ සඳහා එක්රැස් කරන ලදි.

- වකුගඩු ආශ්‍රිත රෝග පවතින දිස්ත්‍රික්ක වල ජලයේ ගුණාත්මක අධ්‍යනය යටතේ ජල සාම්පලරැස් කිරීම සහ ජල මට්ටම් මැනීම මොනරාගල, අම්පාර, කුරුණෑගල, පුත්තලම, අනුරාධපුර, ත්‍රිකුණාමලය සහ පොළොන්නරුව දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි 2019 වර්ෂයේ ඉලක්කය 100% දක්වා සපුරා ඇති අතර ජල සාම්පල විශ්ලේෂණය 49% ක ප්‍රගතියක් අත්කරගෙන ඇත. මීට අමතරව එක් දැනුවත් කිරීමේ වැඩසටහනක් සිදු කරන ලදී.

- හදිසි ආපදා අවස්ථා වල අවශ්‍යතා සඳහා භූගත ජලය සංවර්ධනය කිරීම යටතේ භූ සමීක්ෂණ සිදු කිරීම (30), නල ලිං ඉදි කිරීම(22), ජල ධාරිතා පරීක්ෂණ පැවැත්වීම (05), ජල රසායනික විශ්ලේෂණය (22) ආදී ක්‍රියාකාරකම් සම්පූර්ණ කරන ලදී. මීට අමතර ව දත්ත විශ්ලේෂණය හා වාර්තා කිරීම අවසන් කරන ලදී.

- වියළි කලාපයේ ප්‍රදේශ ආවරණය වන පරිදි පැරණි අත් පොම්ප නල ළිං පුනුරුත්ථාපනය කිරීමේ වැඩසටහන යටතේ මොනරාගල, පුත්තලම සහ අනුරාධපුර දිස්ත්‍රික්ක වල පවතින පැරණි නල ලිං 54ක අත්පොම්ප අලුත්වැඩියා කිරීම හා විදුලි යන්ත්‍ර යොදවා පැරණි නල ලිං පිරිසිදු කිරීම සම්පූර්ණ කරන ලදී.

- භූගත ජලයට අදාල පාරිසරික ගැටළු විසඳීමට අවශ්‍ය ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂණ සිදුකිරීම යටතේ මධ්‍යම පරිසර අධිකාරිය, භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, වයඹ පළාත් පරිසර අධිකාරිය හා අනෙකුත් සම්බන්ධිත ආයතනයන් හා මනා සම්බන්ධීකරණය

සහිතව පුත්තලම, කොළඹ, ගම්පහ, කුරුණෑගල, අනුරාධපුරය, මොණරාගල, කෑගල්ල, මහනුවර, නුවරඑළිය, රත්නපුර හා කළුතර දිස්ත්‍රික්කවල ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු 119ක් සිදු කරන ලදී.

- කාර්යය මණ්ඩල පුහුණු වැඩසටහන් යටතේ පුහුණු වැඩමුළු 19ක් සඳහා කරය මණ්ඩලයේ සාමාජිකයින් 82 දෙනෙකු සහභාගී වන ලදී.

- ජල සම්පත් මණ්ඩලයේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම යටතේ, මොණරාගල පළාත් කාර්යාලයේ වහල අලුත්වැඩියා කිරීම, පුත්තලම පළාත් කාර්යාලයේ ගබඩාව ඉදිකිරීම, අනුරාධපුර පළාත් කාර්යාලයේ වැට ප්‍රතිසංස්කරණ කිරීම යන ක්‍රියාකාරකම් සම්පූර්ණ කර ඇති අතර මොණරාගල පළාත් කාර්යාලයේ සේවක නිවස්නය ඉදිකිරීම 85% ප්‍රමාණයක් සම්පුර්ණ කර ඇත.

2. අමාත්‍යාංශ ප්‍රතිපාදනයටතේ සිදුකරන භූගත ජල සංවර්ධන ව්‍යාපෘති

- යාපනය දිස්ත්‍රික්කයේ භූගත ජල කළමනාකරණ හා සංරක්ෂණ සැලැස්ම සකස් කිරීම ව්‍යාපෘතිය යටතේ 2017 වර්ෂයේ යාපනය දිස්ත්‍රික්කයේ පවතින සියලුම ලිං ලේඛන ගත කිරීම ආරම්භ කරන ලදි. උසස් අධ්‍යාපනය අවසන් කරන ලද සිසුන් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සමබන්ධ වී 2019 වර්ෂයේදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 15 ක් තුල ග්‍රාම නිළධාරී වසම් 278ක් ආවරණය කරමින් ළිං 105,464 ක නිමාන කටයුතු සිදු කර ඇත.

- යාන් ඔය වාරි මාර්ග ව්‍යාපෘතිය ආශ්‍රිත ප්‍රදේශවල වල ජලාශය ඉදිකිරීමෙන් පසු නොගැඹුරු භූගත ජල ධරවල ජලමට්ටම් වෙනස්වීම හා ජලයේ ගුණාත්මකභාවය අධ්‍යනය යටතේ 2019 වර්ෂයේ ඉලක්කගත ප්‍රගතියෙන් ජල ධාරිතා පරීක්ෂණ 100%ක්ද, ජල සාම්පල එක්රැස් කිරීම හා ජල මට්ටම් මැනීම 90%ක්ද, ජල සාම්පල විශ්ලේෂණය 35%ක්ද සම්පුර්ණ කරන ලදී.

- මල්වතු ඔය වාරිමාර්ග ව්‍යාපාතිය ආශ්‍රිත ප්‍රදේශවල නොගැඹුරු භූගත ජලධර වල ජල මට්ටම් වෙනස්වීම හා ජලයේ ගුණාත්මක භාවය අධ්‍යයනය යටතේ 2019 වර්ෂයේ ඉලක්කගත ප්‍රගතියෙන් ජල ධාරිතා පරීක්ෂණ 100%ක්ද, ජල සාම්පල එක්රැස් කිරීම හා ජල මට්ටම් මැනීම 94%ක්ද, ජල සාම්පල විශ්ලේෂණය 71%ක්ද, දත්ත විශ්ලේශණය හා වාර්තා සැකසීම 10%ක්ද සම්පුර්ණ කරන ලදී.

3. උත්පාදිත අරමුදල් ඉපැයීම සඳහා සිදුකරන ලද වානිජ්‍ය ක්‍රියාකාරකම්

මේ යටතේ රාජ්‍ය, රාජ්‍ය නොවන ආයතන සහ ජනතාවගේ පෞද්ගලික ඉල්ලිම් මත ජල සම්පත් මණ්ඩලය මඟින් ඇස්තමේන්තු කොට වානිජ්‍ය මට්ටමින් භූ සමීක්ෂණ (460), නල ලිං ඉදි කිරීම් (117), අත් පොම්ප සවිකිරීම් (16), ජල ධාරිතා පරීක්ෂණ සිදු කිරීම් (317), නල ලිං පිරිසිදු කිරීම් (15), ජල රසායනික විශ්ලේෂණය (510) ආදී ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

විගණකාධිපතිවරයාගේ විගණන විමසුම හා විගණන වාර්ථාවල පෙන්වා දී ඇති ගිණුම්කරණ හා කළමනාකරණ දුර්වලතා නිවැරදි කිරීම පිණිස ගනු ලැබ ඇති ක්‍රියාමාර්ග.

1) ජල සම්පත් මණ්ඩලයට අයත් වාහන 30 ක් සඳහා ලුහුබැඳීමේ යන්ත්‍ර (Vehicle Tracing Solution) සපයා සවිකිරීම සඳහා රු.මි. 1.419 වටිනා කමකට 2019.09.18 දින ගිවිසුමකට එළබී අතර එම ගිවිසුම ප්‍රකාරව එම උපකරණ සවිකරනු ලැබුවත් ජල සම්පත් මණ්ඩලයේ ක්ෂේත්‍රයේ ධාවනය වන යන්ත්‍රෝපකරණ වල ප්‍රයෝගික පවතින ගැටළු නිසාවෙන් අඩුපාඩුකම් පැනනැගුණු අතර එම නිසා මේ සඳහා කිසිදු ගෙවීමක් මෙතෙක් සිදුකර නොමැත.

2) ජල සම්පත් මණ්ඩලය විසින් රු.මි.2.640කට මිලදීගෙන වසර තුනකට වැඩිකාලයක් ගබඩාවේ තිබුණු විදුලි ජනක යන්ත්‍ර 11ක් හා රු.මි. 2.25 මිලට ගෙන තිබූ විදුලි ජනක යන්ත්‍ර 3කින් කොටසක් ගංවතුර අපදා අවස්ථා වලදී ප්‍රයෝජනයට ගැනීමට තබාගෙන ඉතිරිය වාරිමාර්ග දෙපාර්තුමේන්තුව වෙත ලබාදීමට කටයුතු සිදු කර ඇත.

3) අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ රු.මි.280 වැයකර සමාලෝචිත වර්ෂයේදී මිලට ගත් නව විදුම් යන්ත්‍රය හා උපකරණ 2019 මැයි මාසයේදී ලියාපදිංචි කර මෙහි තාක්ෂණික ශක්‍යතාව තහවුරු කිරීම, ප්‍රසම්පාදන කටයුතු අවසන් කිරීම,රත්මලාන පරිශ්‍රයේ පරීක්ෂණ නළ ළිඳ ඉදිකිරීම වැනි කටයුතු සඳහා යෙදවිය. ඉන් අනතුරුව පැවති වැඩ පත්‍රිකා අනුව 2019 වර්ෂයේ ඔක්තෝම්බර් මාසයේ සිට ක්ෂේත්‍රයේ විදුම් කටයුතු සඳහා යොදවන ලදී.

4) අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ 2017 මැයි මාසයේදී ජල සම්පත් මණ්ඩලය භාවිතය සඳහා ජල පොම්ප 50ක් ලැබී තිබුණු අතර එම ජල පොම්ප සම්බන්ධව වාරිමාර්ග දෙපාර්තුමේන්තුව සමග සාකච්චා කොට ජල සම්පත් මණ්ඩලය අවශ්‍ය ප්‍රමාණය තබා ගනිමින් ඉතිරි කොටස වාරිමාර්ග දෙපාර්තුමේන්තුව වෙත ලබාදීමට කටයුතු කර ඇත.

5) පුත්තලම පළාත් කාර්යාලය තුල ස්ථාපිත කර තිබූ ක්ෂුද්‍ර ජීවී රසායනාගාර උපකරණ පසුගිය කාලවකවානුව තුල සේවාදායකයින්ගේ ඉල්ලුම පහල යාම හා ස්ථිර ජල විශ්ලේෂක වරයෙක් නොමැති වීම හේතුවෙන් අදාල පරීක්ෂණ සිදු නොකරන ලද අතර මේ වන විට මෙම උපකරණ අනුරාධපුර පළාත් කාර්යාලයේ ඉදිකර ඇති රසායනාගාරය වෙත භාර දීමට කටයුතු කර අදාල පරීක්ෂණ කටයුතු සඳහා යොමුකොට ඇත.

ජල සම්පාදන මණ්ඩලයේ කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා 2019 වර්ෂය තුළදී ගන්නා ලද ක්‍රියාමාර්ග

1. රට තුළ පවතින භූගත ජලය කළමනාකරණය කිරීම සඳහා යාන්ත්‍රණයක් සකස් කිරීම හා එය ක්‍රියාවට නැංවීම සඳහා ජල සම්පත් මණ්ඩල පනත සංශෝධනය කිරීමට කටයුතු යෙදීම.

2. අදාළ කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා ජල සම්පත් මණ්ඩලයේ බඳවා ගැනීමේ පටිපාටිය පුළුල් කිරීම සඳහා කටයුතු සම්පාදනය කිරීම

3. ස්ථාවර වත්කම් කළමනාකරණය සහ පාලනය වඩාත් කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා මෘදුකාංග යොදා ගැනීම තව දුරටත් ක්‍රියාත්මක කිරීම.

4. අවශ්‍ය තාක්ෂණික කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා කටයුතු සම්පාදනය කිරීම.

5. මණ්ඩලයේ කටයුතු පවත්වා ගැනීම සඳහා අවශ්‍ය උපකරණ හා අමුද්‍රව්‍ය සම්පාදනය කිරීම.

6. කාර්ය මණ්ඩලයට අවශ්‍ය කළමනාකරණ සහ තාක්ෂණික දැනුම ලබා ගැනීම සඳහා පුහුණු වීම් ලබා දීම.

7. මණ්ඩලයේ සියලුම අංශ වල ප්‍රගතිය සති පතා පරීක්ෂා කිරීම.

8. මණ්ඩලයේ සියලුම කටයුතු පිළිබඳව පසු විපරම් කිරීම.